# මානව හිමිකම් මූලාශ්‍ර සහ එහි විකාශනය


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

ප්‍රථම මුද්‍රණය : 2015

උපදේශකත්වය : නීතිඥ නිමල් පී පුංචිහේවා
නීතීඥ සමන්ති ජයමාන්න පරණගම

සංස්කරණය : නීතිඥ මේනකා හේරත්
නීතීඥ කේ. කපිලන් විල්ලවරාජන්

සහාය : තුෂාරා ජීවන්ති

පිටුසැකසුම සහ මුද්‍රණය : විකුම් ග්‍රැෆික්ස්, නො 33, මායා මාවත,
පතිරගොඩ, මහරගම.

ප්‍රකාශනය : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
අංක 165, කින්සි පාර, කොළඹ 08.

ISBN 978-955-8929-25-4

9 789558 929254

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහජන ව්‍යාපෘතියකි

| පටුන | | පිටුව |
|---|---|---|
| **1.0** | **මානව හිමිකම් ඓතිහාසික විකාශය** | 1 |
| 1.1 | ආගමික ඉගැන්වීම් | 1 |
| 1.1.1 | බෞද්ධ දර්ශනය | 3 |
| 1.1.2 | හින්දු ආගම | 4 |
| 1.1.3 | ක්‍රිස්තියානි ධර්මය | 4 |
| 1.1.4 | ඉස්ලාම් ධර්මය | 4 |
| 1.2 | මානව හිමිකම් සඳහා වූ ඓතිහාසික අඩිතාලම සහ මානව හිමිකම් ප්‍රකාශන | 5 |
| 1.3 | දර්ශනවාදී දෘෂ්ටියෙන් මානව හිමිකම් දෙස බැලීම | 5 |
| 1.4 | දේශපාලන වර්ධනය | 7 |
| 1.4.1 | මැග්නාකාර්ටා පත්‍රය | 9 |
| 1.4.2 | එංගලන්ත අයිතිවාසිකම් කෙටුම්පත | 10 |
| 1.4.3 | මිනිසාගේ හා පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය - ප්‍රංශය | 11 |
| 1.4.4 | ඇමරිකානු අයිතිවාසිකම් පනත | 12 |
| 1.4.5 | මානව අයිතීන් දිනා ගැනීමේ අරගල | 13 |
| **2.0** | **මානව හිමිකම් යනු කුමක්ද ?** | |
| 2.1 | මානව හිමිකම් වල ස්වභාවය (ලක්ෂණ) | 15 |
| 2.2 | අයිතිවාසිකම් වර්ග කිරීම | 16 |
| 2.2.1 | පරම්පරාව අනුව | 16 |
| 2.2.2 | ධනාත්මක අයිතිවාසිකම් සහ ඍණාත්මක අයිතිවාසිකම් | 18 |
| 2.2.3 | තනිපුද්ගල අයිතිවාසිකම් සහ සාමූහික අයිතිවාසිකම් | 19 |
| 2.2.4 | අයිතිවාසිකම් අයිතීන්වල ස්වභාවය අනුව වර්ග කිරීම | 19 |
| **3.0** | **ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් හා එහි වර්ධනය** | |
| 3.1 | එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය | 20 |
| 3.2 | මානව හිමිකම් විශ්ව ප්‍රකාශය | 21 |
| 3.3 | එක්සත් ජාතීන්ගේ ගිවිසුම් | 23 |
| 3.3.1 | සියළු ආකාරයේ වාර්ගික අසමානතා පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය | 26 |

3.3.2 සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 26
3.3.3 ආර්ථික, සංස්කෘතික හා සමාජ අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 27
3.3.4 කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස් කොට දැක්විම වැළැක්වීමේ සම්මුතිය 28
3.3.5 කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය විමෙන් වැලකී සිටීමේ සම්මුතිය 29
3.3.6 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 29
3.3.7 සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය 30
3.3.8 පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය 31
3.3.9 ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 32
3.4 එක්සත් ජාතීන්ගෙන් බැහැර වු ගිවිසුම් 33
3.4.1 රෝම ව්‍යවස්ථාව 33
3.4.2 ජිනීවා සම්මුතිය 33
3.5 මානුෂවාදී නීතිය හා මානව අයිතිවාසිකම් නීතිය අතර සම්බන්ධය 34

**4.0 කළාපීය මානව හිමිකම් වලට අදාල ප්‍රමිතීන් හා ඒවායේ වර්ධනය** 35
4.1 මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතිය 35
4.2 යුරෝපීය සමාජ සම්මුති පත්‍රය 35
4.3 කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ යුරෝපා සම්මුතිය 36
4.4 මානව හිමිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතිය 36
4.5 පුද්ගල අයිතීන් පිළිබඳ අප්‍රිකානු සම්මුති පත්‍රය 36
4.6 මානව හිමිකම් පිළිබඳ අරාබි ප්‍රඥප්තිය 36

**5.0 විශ්විය මානව හිමිකම් අභිමුව විවිධ සංස්කෘතීන් හි සාපේක්ෂ වෙනස** 37
5.1 සංවර්ධනය සඳහා අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්ම 37

**6.0 විශ්විය මානව හිමිකම් අභිමුව විවිධ සංස්කෘතීන්හි සාපේක්ෂ වෙනස** 38

**7.0 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රමිතීන් හා එහි වර්ධනය** 39
7.1 අතීත ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම 40
7.2 යටත් විජිත යුගයේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම 41
7.3 නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම 42

**8.0 මානව හිමිකම් පිළිබඳ නවමු මතවාදයන්** 46
8.1 මානව හිමිකම් සහ ගෝලීයකරණය 46
8.2 මානව හිමිකම් හා ව්‍යාපාරකරණය 46
8.3 මානව හිමිකම් සහ තාක්ෂණය 47
8.4 ඩිජිටල් යුගය සහ පුද්ගලික නිදහස 47
8.5 මානව හිමිකම් සහ කාලගුණික වෙනස්වීම් 47
8.6 මානව හිමිකම් සහ දරිද්‍රතාවය 48
8.7 මානව හිමිකම් හා දූෂණය 48
8.8 ලිංගිකත්වය මත වෙනස්වීමකට ලක්වන ජන කණ්ඩායම් 48
8.9 ප්‍රජනන අයිතිවාසිකම් 49

**9.0 රාජ්‍ය වගකීම** 50
9.1 මානව හිමිකම් වලට ගෞරව කළ යුතුය. 50
9.2 මානව හිමිකම් ආරක්ෂා කිරීම 50
9.3 මානව හිමිකම් සපුරාලිය යුතුය 51

**10.0 නිගමනය** 51

## හැදින්වීම

මිනිසාගේ මුලාරම්භයේ සිට මානව හිමිකම් සංකල්පය බිහි වී ඇත. මිනිසා බිහි වූ දා සිට ශිෂ්ටාචාරගත වීම දක්වා වූ දැවැන්ත ක්‍රියාවලිය තුළ සමාජ, ආර්ථික, දේශපාලන හා නෛතික වර්ධනයත් සමගම මානව හිමිකම් සංකල්පයත් වඩ වඩාත් වර්ධනය වූ අතර එය තවදුරටත් නොනවත්වා වර්ධනය වෙමින් පවතී. මෙම සංකල්පය විවිධ ආගම් තුළ පවත්නා සාර ගුණාංගයන්ගෙන් පෝෂණය වී ඇත. එමෙන්ම දර්ශනවාදීන් මෙම සංකල්පය විග්‍රහ කරනු ලබන්නේ ස්වභාවික නීති මුල් කර ගනිමිනි.

තවදුරටත් විවිධ වූ විප්ලව, අරගල හරහා මිනිසුන් විසින් කරන ලද අනේකවිධ පරිත්‍යාගයන් අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාවලිය සවිමත් කිරීමට පිටුවහලක් වී ඇත. මෙම අයිතිවාසිකම් වර්තමානයේ මානව හිමිකම් යනුවෙන් හඳුන්වනු ලබයි. විශේෂයෙන්ම පළමු හා දෙවන ලෝක සංග්‍රාමයන්හි දී සිදුවුනාවූ අති මහත් ව්‍යසනයන්ගෙන් පසුව මිනිසා තවත් මිනිසකුගේ ගරුත්වය ආරක්‍ෂා කළ යුත්තේ මන්ද සහ කෙසේ ද යන්න ලෝක ජනයා අතර වැඩි වැඩියෙන් කථාබහට ලක්විය. එහි ප්‍රතිඵලයක් ලෙසට මානව හිමිකම් ආරක්‍ෂා කිරීමට සහ ඒවාට ගරු කිරීම සඳහා රටවල් එකමුතුව මානව හිමිකම් ඇතුලත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කරනු ලැබීය.

මානව හිමිකම්හි අනාගත ප්‍රගමනය සඳහා විශේෂිත වූ එක් ලියවිල්ලක් අවශ්‍ය බව තහවුරුවීමෙන් අනතුරුව එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශය එළිදක්වන ලදී. මෙය මානව හිමිකම්හි පදනම වේ. මෙය පදනම් කරගනිමින් තවදුරටත් එය වර්ධනය කරමින් සම්මුතීන්, ප්‍රඥප්තීන්, කෙටුම්පත්, ගිවිසුම් හා එකගතාවයන් ලොවට බිහි වී ඇත. මෙම සම්මුති හරහා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, විවිධ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ අයිතිවාසිකම්, සංක්‍රමණික සේවකයන්ගේ අයිතිවාසිකම්, වධහිංසාවන්ගෙන් තොරවීමට ඇති අයිතිවාසිකම්, පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්‍ෂා වීමේ අයිතිවාසිකම් තහවුරු කර ඇත.

එමෙන්ම කලාපීය වශයෙන් ද මානව හිමිකම් ආරක්‍ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඒ ඒ කලාපයන්ට ගැළපෙන ආකාරයෙන් විවිධ මානව හිමිකම් ලේඛන සකස්කර ඇත.

මෑතකාලයේ දී ජාත්‍යන්තර අවධානය සාමූහික අයිතිවාසිකම් සම්බන්ධයෙන් යොමු විය. ඒ අනුව සංවර්ධනය සඳහා අයිතිවාසිකම් පදනම් කර ගත් ප්‍රවේශයක් වෙත ලෝක ජනතාව යොමු වී ඇත. මානව හිමිකම් නව පැතිකඩයන් ඔස්සේ තවදුරටත් වර්ධනය වීමෙන් අනතුරුව මානව හිමිකම් සහ ගෝලීයකරණය, මානව හිමිකම් සහ ව්‍යාපාරකරණය, මානව හිමිකම් සහ දරිද්‍රතාව, ආදී සංකල්පයන් ජාත්‍යන්තරව කථාබහට ලක්වේ.

මේ ආකාරයෙන් මානව හිමිකම් සංකල්පය නවමු පැතිකඩයන් හරහා විකාශය වී මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්‍ෂා කිරීම මගින් මිනිසාගේ අයිතිවාසිකම් සුරක්‍ෂිත කර යහපත් මානව හිමිකම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමට මෙමගින් පිටුවහලක් උදා කර ගැනීම අරමුණ වේ.

මේ සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක හෝ අදහසක්, මතවාදයක් ජනතාව තුළ ඇති කිරීමේ අරමුණ පදනම් කරගනිමින් මෙකී දැනුම් සම්භාරය ඔබ වෙතට ලබා දේ.

## 1.0 මානව හිමිකම්හී ඓතිහාසික විකාශය

මානව හිමිකම් සංකල්පය දර්ශනය, දේශපාලනය, නීතිය සහ සමාජමය ප්‍රතිචාර ඔස්සේ දීර්ඝකාලීන පරිනාමයට භාජනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූවකි. මානව හිමිකම් සංකල්පය ගතික ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. මානව හිමිකම් සංකල්පයෙහි ඇති මෙම වෙනස්වන සුළු ස්වභාවය නිසා නිරන්තරයෙන් එය පුළුල් වෙමින් පවතී. ඒ අනුව මනුෂ්‍ය සමාජයේ උපරිම සංවර්ධනය සඳහා අලුත් විෂය කරුණු මානව හිමිකම් ක්ෂේත්‍රය තුල සාකච්ඡාවට භාජනය වෙයි. හුදෙක්ම මානව හිමිකම් යන වචනද මෑතකදී බිහිවූවකි. එය එසේ වුවද මානව හිමිකම් සංකල්ප මනුෂ්‍ය ශිෂ්ටාචාරයත් සමග දැඩිව බැදී පැවති බව පැහැදිලිව පෙනී යයි. වර්තමාන නවීන ලෝකයේ මානව හිමිකම් වලට ඇති වැදගත්කම තව තවත් ශක්තිමත් වෙමින් පවතින අතර ඒ දෙස විද්වතුන් විසින් විවිධ කෝණයන්ගෙන් සලකා බලමින් සිටියි.

## 1.1 ආගමික ඉගැන්වීම්

අතීතයේ සිට ආගමික ඉගැන්වීම්වල මානව හිමිකම් පිළිබඳව ගැඹුරින් ඇතුලත් වී ඇති බව දක්නට ලැබේ. මේ සම්බන්ධයෙන් වාචික හා ලිඛිත ලේඛන මගින් ඒ බව හඳුනාගෙන ඇත. සමහර ලිඛිත ලේඛන ලෝකයේ ඇති පැරණි ආගමික පාරිශුද්ධ පොත් ආකාරයෙන් ඇත. බුදු දහමේ ධම්ම පදයේ ද හින්දු ආගමේ වේද ග්‍රන්ථ වල ද ක්‍රිස්තු දහමේ බයිබලයේ ද ඉස්ලාම් ආගමේ කුරානයේ ද යුදෙව්වන්ගේ ආගමේ ඩෝරා හි ද මානව හිමිකම්හි ගති ස්වභාවයන් පෙන්වා දේ.

### 1.1.1 බෞද්ධ දර්ශනය

බෞද්ධ ඉගැන්වීම් තුල මෙන්ම බෞද්ධ ඉතිහාසයේ හා බෞද්ධ සාහිත්‍යයේද මානව හිමිකම් පිළිබඳව අදහස පවතින බව පෙනී යයි.

බෞද්ධ දර්ශනයේ මානව හිමිකම් පිළිබඳ අදහස් ප්‍රකාශ කළ අවස්ථා පිළිබඳ උදාහරණ කිහිපයක් දැක්විය හැකිය.

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ
(ධම්ම පදයේ දණ්ඩ වග්ගය 2:130)

සියල්ලෝ දඬුවමට තැති ගනිත්, සියල්ලෝ මරණය බිය වෙත්, ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය.

සුඛකාමානී භූතානී
යො දණ්ඩෙන විහිංසතී
අත්තනො සුඛමෙසානො
පෙච්ච සො න ලභතෙ සුඛං
(දණ්ඩ වග්ගය 3:131)

යමෙක් තමා සැප බලාපොරොත්තුවෙන් තමා සේම සැප කැමති සත්වයන් දණ්ඩෙන් පෙළයි ද හේ පරලොව දී සැප නොලබයි.

අලඞ්කතෝ චෙපි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බේසු භූතෙසු නිධාය දණ්ඩං
සෝ බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු
(දණ්ඩ වග්ගය 14 : 142)

යමෙක් ඇඳුම් පැළඳුම් වලින් අලංකාරව සිටියත් (කයෙන් සිදුවන වැරදි තොරව) ශාන්ත දාන්තව නියත බ්‍රහ්මචාරියකුව සමව හැසිරේ නම්, සියලු දෙනාටම හිංසා කිරීමෙන් වළකී නම් ඔහු නියම බ්‍රාහ්මණයෙකි, ශ්‍රමණයෙකි, භික්ෂුවකි.

වැඩිදුරටත් බෞද්ධ දර්ශනය තුල සියළුම සත්වයන්ට යහපත් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳව අවධාරණය කරන අතර සිගාලෝවාද සූත්‍රයෙන් සමාජ ස්ථරයන්හි යුතුකම් මෙන්ම වගකීම් පිළිබඳවද කථා කරයි.

තවද බුදු දහම සෑම විටම සියළුම සත්වයන් සමාන ලෙස සළකන අතර කිසිවකු කිසිදු ලෙසකට වෙනස් කොට නොසැලකිය යුතු බව අවධාරණය කරයි. මිනිසා වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වන්නේ උපතින් නොව ඔවුන්ගේ ක්‍රියාවන්ගෙන් බව වැඩිදුරටත් බුදු දහමේ දේශනා කරයි.

## 1.1.2 හින්දු ආගම

හින්දු ආගමෙහි මානව හිමිකම් සහ යුතුකම් හා වගකීම් යන විෂයයන් සම්බන්ධයෙන් මනාව පැහැදිලි කර ඇති වේද ග්‍රන්ථ 04ක් ඇත. ඉන් එකක් ඍග් වේදයයි. එහි සඳහන් වී ඇත්තේ

"අජස්තාෂෝ අබනිදාෂ රුඅඩි
සුම් සම්ප්‍රාදාරෝ වාවුඩහු සෞභාගයා" [1]

ඉන් අදහන් වන්නේ කිසිවකුත් උසස් හෝ පහත් නොවේ. සියල්ලෝම සහෝදරයන්ය බවයි. සැමදෙනාම සැමදෙනාගේම සුභ සිද්ධියට සත්‍යවාදීව වැඩ කල යුතු අතර සැමදෙනාගේම එකමුතුවෙන් දියුණුව සලසා ගත යුතුයි.

හින්දු ආගමේ සන්තෝෂ වීමට ඇති අයිතිය සෑම මනුෂ්‍යයෙකුගේම උත්කෘෂ්ඨම මූලික අයිතිවාසිකමක් ලෙස සලකනු ලැබේ. තවද අධර්ව වේදයේ විවිධ අයිතිවාසිකම් සහ බැදීම් හෝ වගකීම් අවධාරණය කරයි. අධර්ව වේදයේ සඤ්ඤාණ සූත්‍රයේ දී ජීවිතය නැමැති කරත්තයේ රෝද දරන්නාවූ දණ්ඩ සෑම දෙනාගේම උරහිසේ සමානව රඳවා ගෙන සිටී. සැමදෙනා එකිනෙකාට සහයෝගයෙන් හා සාමයෙන් ජීවත් විය යුතුය. තවද හැමෝටම සමානව ආහාර සහ ජලය ලබා ගැනීමට ඇති අයිතිය ඇති බව සඳහන් කර ඇත.

එකිනෙකාට පැවරී ඇති රාජකාරි ඉටු කිරීම මත මානව හිමිකම් රැකෙන බව හින්දු ආගමේ පිළිගැනේ. එම නිසා ඔවුන්ගේ උසස්ම අපේක්ෂාව කර්මයයි. (රාජකාරි ඉටු කිරීම)

---

[1] ඍග් වේද මණ්ඩලය 05, සූත්‍ර 60, මන්ත්‍ර 05

## 1.1.3 ක්‍රිස්තියානි ධර්මය

බයිබලයේ මුලාරම්භයේ සිට මනුෂ්‍යයාගේ කාර්යයන් (Obligation) අවධාරණය කරයි. වගකිවයුතු පුද්ගලයින් තම අසල්වාසීන් දෙවියන්ගේ දරුවන් සේ සලකා ක්‍රියා කල යුතුය. සැමදෙනාම යම් රාමුවක් තුල සිට කටයුතු කල යුතු බව බයිබලයේ තවදුරටත් සඳහන් වේ. අයිතීන් මානව ගරුත්වයේ සිට පටන් ගැනේ. මන්ද ක්‍රිස්තියානුවන්ගේ විශ්වාසය වන්නේ සැමදෙනාම දෙවියන් වහන්සේගේ සෙවනැල්ලෙන් උපත ලද බවයි.[2] එම ජීවිත විනාශ කිරීම හෝ ජීවත් වීමේ අයිතිය පැහැර ගැනීමේ කිසිදු අයිතියක් හෝ බලයක් කිසිවෙකුට නැත.[3] මනුෂ්‍යයා ගෞරවනීය පුද්ගලයෙක් වන අතර අනෙක් සත්වයන් අතරින් උසස් කෙනෙකු බව සඳහන් වේ.[4]

## 1.1.4 ඉස්ලාම් ධර්මය

ඉස්ලාම් ධර්මය අල් කුරානය පදනම් කරගෙන පවතින්නකි. කුරානයේ මානව හිමිකම් සංකල්ප බොහොමයක් සුරාවල සඳහන් කර ඇත. කුරානය දක්වන පරිදි සෑම මනුෂ්‍ය දරුවකුටම සමානාත්මතාවයෙන් සැලකිය යුතුය. කෙනෙකුගේ පෙනුම හේතුවෙන් වෙනස් ලෙස සැළකීම නොකල යුතුයි. එක් මනුෂ්‍යයෙක් තවත් මනුෂ්‍යයෙකුගෙන් වෙනස් නොවේ.[5] මේ අයිතිවාසිකම් අල්ලා දෙවියන් ප්‍රදානය කර ඇත. මෙම අයිතීන් පාලකයින් හෝ අධිරාජ්‍යයන්ට ඉවත් කල නොහැකිය.

අල් කුරානයේ ප්‍රධානම අයිතිවාසිකමක් ලෙස ජීවත් වීමට ඇති අයිතිය සඳහන් කොට ඇත. කුරානයේ දෙවියන් විසින් ප්‍රදානය කරන කරන ලද මනුෂ්‍ය ජීවිතය කිසිවෙකුටත් අහිමි කල නොහැකිය යනුවෙන් සඳහන් කර ඇත.[6]

අනෙක් ප්‍රධානතම අයිතිවාසිකම වන්නේ මනුෂ්‍යයාට ගරු කිරීමයි. තවද කුරානයේ නිදහස්ව සිටීමට ඇති අයිතිය, පුද්ගලිකත්වයට ඇති අයිතිය, නින්දාකිරීම සහ කෙනෙකු නොමැති අවස්ථාවක දොස් තැබීමෙන්,

[2] Genesis 1:27
[3] Genesis 9:6
[4] Genesis 1:26
[5] අල්කුරානයේ 17 : 70
[6] අල්කුරාන් සුරා 6 : 151

උපහාසාත්මක ආකාරයෙන් කරනු ලබන විහිළු වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය ද දැනුම ලබා ගැනීමට හා රැකියාවක නිරත වීමට ඇති අයිතිය එමෙන්ම වඩා හොඳින් ජීවත් වීමට ඇති අයිතියත් සඳහන් වී ඇත.

## 1.2 මානව හිමිකම් සදහා වූ ඓතිහාසික අඩිතාලම සහ මානව හිමිකම් ප්‍රකාශන

ක්‍රිස්තු පූර්ව (ක්‍රි.පූ.) 1772 පමණ විසූ බැබිලෝනියානු රජ කෙනෙකු වන හමුරාබි රජු විසින් සකස් කරනු ලැබූ බැබිලෝනියන් නීති සංග්‍රහය හෙවත් හමුරාබි නීති සංග්‍රහ ඉතා වැදගත්ය. එහි කාන්තා අයිතිවාසිකම්, පුරුෂ අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම්, වහල් අයිතිවාසිකම්, සාධාරණ වැටුප් සහ දේපල වල ආරක්ෂාව ඇතුලත් කර ඇත.



1 ඡායාරූපය හමුරාබි නීති සංග්‍රහය සෙල්ලිපිය

තවද මෙහි හේතුව, ප්‍රතිඵලය සහ ස්වභාවය (casue & effect nature) පාවිච්චි කර ඇත. එයින් අදහස් වන්නේ යම් හානියක් සිදු වූ කෙනෙකුට හානිය සිදු කලා වූ තැනැත්තා විසින් වන්දි ගෙවිය යුතු බවය. උදාහරණ වශයෙන් කෙනෙකුගේ ඇසට හානි කළහොත් හානි කළ පුද්ගලයාගේ ඇසකින් ඒ වන්දිය ගෙවිය යුතුය. දතකට හානි වුවහොත් හානි කළ පුද්ගලයාගේ දතක් ගලවා අදාළ වරදට දඬුවම ලබා දෙයි.

ක්‍රි.පූ.622 මොහොම්මදු රාජ්‍ය යුගයේ දී මදීනා ප්‍රඥප්තිය මගින් මදීනා ගෝත්‍රික පවුල් හා අනෙකුත් ගෝත්‍රික කණ්ඩායම්, මුස්ලිම් හා යුදෙව් ජාතීන් සහ මොහොමඩ් අතර ගිවිසුම ඇති කර ගන්නා ලදී. මෙයට ඔවුන් අතර ඇතිවන යුධ තත්ත්වයන් වැලැක්වීම ආගමික නිදහස සහ කාන්තාවන්ගේ ආරක්ෂාව ඇතුලත් කර ඇත.



2 ඡායාරූපය සයිරස් සිලින්ඩරය

මීට අමතරව පැරණි මුලාශ්‍රයන් ගැඹුරින් සලකා බැලීමේ දී ක්‍රි.පූ. 539 නියෝ බැබිලෝනියන් අධිරාජ්‍යයේ මහා සයිරස් පර්සියානු අධිරාජ්‍යයාගේ සයිරස් සිලින්ඩර් (The Cyrus Cylinder) නැමති ප්‍රකාශනය මානව හිමිකම් ආරක්ෂාව තහවුරු කෙරෙන ලිඛිත සාධක වල ආරම්භය බව පෙනී යයි. මෙහි වහල්භාවයෙන් නිදහස, කැමති ආගමක් තෝරා ගැනීමට ඇති අයිතිය සහ ජාතීන් අතර සමානාත්මතාවයට ඇති අයිතිය ඇතුලත් කර ඇත. මෙය ලෝකයේ පළවෙනි මානව හිමිකම් ප්‍රඥප්තිය බවට සලකනු ලැබේ.


පුරාණ ග්‍රීසියේ මුල් අවධියේ දී පෝලිසිල් පුරවැසි ප්‍රතිපත්තිය ආරම්භ කර ඇත. එහි ඔවුන් සියලු දෙනා ස්වාධීන පුරවැසියන් බවත් ඔවුනට කථා කිරීමටත් ඡන්දය ප්‍රකාශ කිරීමටත් අයිතියක් ඇති බව සඳහන් වී ඇත.

තවද ක්‍රි.පූ. 272 - 231 ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා ද රටපුරා කරවූ ශිලා ස්ථම්භයන්හි මානව හිමිකම් සුරැකීමේ නීති සටහන් කර ඇත. එහි අශෝක ප්‍රකාශනයන්හි මහජන ප්‍රතිපත්ති වල රජුගේ ඉවසීමේ ස්වභාවය තහවුරු කර ඇත. තවද යුධ අවස්ථාවන්හිදී යුධ සිරකරුවන් මරණයට පත් කිරීම සහ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ගත යුතු පියවරයන් සම්පූර්ණයෙන් විස්තර කර ඇත.

වැඩිදුරටත් අරාබි සහ චීන දර්ශනවාදීන්ගේ ග්‍රන්ථ මගින් ද ඉපැරණි රෝම නීති මගින් ද මානව හිමිකම් ගති ලක්ෂණ අනාවරණය කර ගත හැක.

## 1.4 දර්ශනවාදී දෘෂ්ටියෙන් මානව හිමිකම් දෙස බැලීම

නොයෙක් කාලවකවානු වල ජීවත් වූ විවිධ දර්ශනවාදීන් විසින් මානව හිමිකම් පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. මුලින්ම මානව හිමිකම් පිළිබඳ සංකල්ප ඉදිරිපත් වන්නේ සම්ප්‍රදායික ග්‍රීක දාර්ශනිකයකු වන ඇරිස්ටෝටල් විසිනි. එහිදී ඔහු විසින් ස්වභාවික අයිතීන් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලද අතර එම අදහස් තෝමස් ඇක්වයිනාස් විසින් වර්ධනය කරනු ලැබීය. ස්වභාවික නීතිය හමුවේ මනුෂ්‍යයින් සියලු දෙනාම සමාන වේ. සැමදෙනාටම සමානව සැලකිය යුතුය යන පදනම මත ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ සමානාත්මතාවය යන සංකල්පය වර්ධනය වීමට හේතුවිය.



3 ඡායාරූපය ඇරිස්ටෝටල්

[7] ශ්‍රී ලංකාවේ ශිලාලේඛනවලින් හෙළිවන මානව අයිතිවාසිකම්, ගමගේ ධම්මිකා ප්‍රියදර්ශනී, සූරිය ප්‍රකාශකයෝ - මරදාන 2009



6 ඡායාරූපය  තෝමස් හොබ්ස්

තවද ජෝන් ලොක්, තෝමස් හොබ්ස් හා ඉමානුවෙල් කාන්ට් යන දාර්ශනිකයන් තිදෙනා දැක්වූයේ මිනිසා සතු මූලික මානව අයිතිවාසිකම් උපතින්ම ලැබෙන දායාදයක් බවත්, එය මිනිසුන් ලෙස උපත ලැබූ නිසාම හිමිවන බවත්ය. මෙම දාර්ශනිකයන්ට අනුව අයිතීන් මානව අයිතීන් ලෙස හඳුන්වනු ලබන්නේ ඒවා විශ්ව සංකල්පයන් නිසා බොහෝ දෙනෙකුට පැවරිය නොහැකි අයිතීන් ලෙසය.

ඉමානුවෙල් කාන්ට් විසින් දක්වා ඇති අන්දමට මිනිසා රාජ්‍ය සංස්ථාවක සමාජගත කිරීම තුලින් තම අයිතීන් ආරක්ෂා කිරීමටත් එකිනෙකාගේ ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමටත් හැකියාවක් ඇති බව දක්වයි.



4 ඡායාරූපය  ඉමානුවෙල් කාන්ට්



5 ඡායාරූපය ජෝන් ලොක්

තවද කාන්ට් දක්වන පරිදි රජයක් විසින් අනුගමනය කළ යුත්තේ නියම කිරීමකින් හා විශ්ව ගත අවනත වීමකින් දියුණු වන ලද නීති වේ. එම නීති මගින් ජනතාවගේ සමානාත්මතාවය, නිදහස සහ ස්වයං පාලන අයිතියට ගරු කිරීම වැදගත් බව සඳහන් කරනු ලැබීය.

මෙලෙස දර්ශනවාදීන්ගේ අදහස් මානව හිමිකම් හි වර්ධනයට විශාල බලපෑමක් සිදු කරනු ලැබීය.

## 1.5 දේශපාලන වර්ධනය

ලෝක ඉතිහාසයේ මානව හිමිකම් සංකල්ප දේශපාලනය තුල ඇතුලත් කර ඇත්තේ පහත සඳහන් කරන ලද ප්‍රධාන ලියවිලි මගින්ය.

### 1.5.1 මැග්නාකාර්ටා (මහා අධිකාරී) පත්‍රය

මානව හිමිකම් පිළිබඳ ඉතාමත් වැදගත් සංසිද්ධියක් ලෙස මැග්නාකාර්ටා ගිවිසුම දැක්විය හැකිය. වර්ෂ 1215 වන විට එංගලන්තයේ රජු වූ ජෝන් රජු විසින් එංගලන්තයේ පැවති පැරණි හා සම්ප්‍රදානුකූල නීති රාශියක් උල්ලංඝනය කරනු ලැබීය. ඒ අනුව මැග්නාකාර්ටා ගිවිසුම අත්සන් කිරීමට එකල රදලයන් විසින් රජුට බල කරනු ලැබීය. ඒ අනුව

- රජයේ ඇඟිලිගැසීම් වලින් මුක්ත වීමේ අයිතිය පල්ලිය සතු වේ.
- සියළුම නිදහස් වැසියන්ට තම දේපල හැසිරවීමේ අයිතිය හා අධික බදු වලින් ආරක්ෂා වීමට අයිතිය ඇත.
- තමන් සතු දේපල ඇති වැන්දඹුවන්ට නැවත විවාහ වීමේ අයිතිය
- නීතිය ඉදිරියේ සමානාත්මතාවය
- අල්ලස් ගැනීම සහ රාජකාරීමය වැරදි සිදු කිරීම දැඩිව ප්‍රතික්ෂේප කිරීම



7 ඡායාරූපය මැග්නාකාර්ටා ගිවිසුම

නූතන ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය වීමට පසුබිම සැපයූ වැදගත් නීතිමය ලියවිල්ල ලෙස මැග්නකාර්ටා පත්‍රය හැඳින්විය හැකිය. එංගලන්තය තුල රදල ජනයාගේ නිදහස ස්ථාපිත කිරීමට වෑයම් කරන අවස්ථාවේදී මෙම ගිවිසුම වැදගත් සන්ධිස්ථානයක් විය.


## 1.5.2 එංගලන්ත අයිතිවාසිකම් කෙටුම්පත - 1689

මෙය එංගලන්ත පාර්ලිමේන්තුව විසින් 1689 දෙසැම්බර් 16 දින සම්මත කර ගත් පනතකි.

මෙකී පනත මගින් ඉංග්‍රීසි ජාතිකයන්ට මූලික අයිතිවාසිකම් කිහිපයක් හඳුන්වාදෙනු ලැබීය.  එකී පනතේ සඳහන් අයිතිවාසිකම් කිහිපයක් පහත පරිදි වේ.

- නීතියට රාජකීය මැදිහත් වීමක් සිදු නොවිය යුතුය. රජුට ඒක පාර්ශවීය නීති සකස් කළ නොහැකිය.
- බදුපැනවීම රජුගේ පරමාධිකාරිය නොවන අතර නව බදු පැනවීමට ප්‍රථම පාර්ලිමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතුය.
- ප්‍රතිඵල පිළිබඳ බියකින් තොරව අධිරාජ්‍යයට එරෙහිව පැමිණිලි කිරීමේ  නිදහස පවතියි.
- සාමකාමී කාලයන්හිදී පාර්ලිමේන්තුවේ අනුමැතිය නොමැතිව යුධ හමුදාව සීරුවෙන් නොතැබිය යුතුය.
- පාර්ලිමේන්තුවට සාමාජිකයන් පත්කර ගැනීමේ ඡන්දයන්හිදී රාජකීය මැදිහත්වීම නොතිබිය යුතුය.
- පාර්ලිමේන්තුව තුල සිදු කරන කථා, විවාද කිසිදු අධිකරණයක හෝ පාර්ලිමේන්තුවෙන් පිටතදී ප්‍රශ්න කිරීමෙන් මුක්ත වීමේ නිදහස
- තම ආරක්ෂාව වෙනුවෙන් තම තත්වයට නියමිත නීත්‍යානුකූල ආයුධ  භාවිතා කිරීමට ජනතාවට ඇති අයිතියට රජුගෙන් බලපෑමක් නොවිය යුතුය.

- වරදකරු වීමට පෙර දඬ නොගැසිය යුතුය
- අධික ඇප මුදල් හෝ කෲර හා අසාමාන්‍ය දඬුවම් නොපැමිණිය යුතුය.




8 ඡායාරූපය එංගලන්ත අයිතිවාසිකම් කෙටුම්පත

## 1.5.3 මිනිසාගේ හා පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය - ප්‍රංශය

1789 දී ප්‍රංශ ජනතාව විසින් සම්පූර්ණ රාජාවලිය බලයෙන් ඉවත් කල අතර පළමු ප්‍රංශ සමූහාණ්ඩුව ඇති කරගනු ලැබීය. මිනිසාගේ හා පුරුවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය ජාතික ව්‍යවස්ථාපිත සංගමය විසින් සකස් කරනු ලැබීය.

මෙම ප්‍රකාශයට අනුව සෑම පුරවැසියකුගේම පහත අයිතීන් තහවුරු කර ඇත.

- ස්වාධීනත්වයේ අයිතිවාසිකම,
- දේපළ අයිතිවාසිකම,
- ආරක්ෂාවේ අයිතිවාසිකම,
- කෲර පාලනයට විරුද්ධවීමේ අයිතිය




9 ඡායාරූපය ප්‍රංශ ප්‍රකාශය

## 1.5.4 ඇමරිකානු අයිතිවාසිකම් පනත 1791

එක්සත් ජනපදයේ පුරවැසියන්ගේ මූලික නිදහස ආරක්ෂා කිරීමට ඇමරිකානු අයිතිවාසිකම් පනත සකස් කරනු ලැබ ඇත.

මෙමගින්

- කථා කිරීමේ අයිතිය
- ආගමික නිදහස

- ආයුධ තබා ගැනීමේ හා දැරීමේ අයිතිය
- සමාගමේ (රැස්වීමේ) අයිතිය
- අභියාචනා කිරීමේ අයිතිය

වැනි අයිතීන් ආරක්ෂා කර ඇති අතර තවද අසාධාරණ සෝදිසි කිරීම් හා බලෙන් අල්ලා ගැනීම්, කෲර හා අසාමාන්‍ය දඬුවම් හා බලෙන් වරද පිළිගැනීමට යොමු කිරීම ද මෙහිදී තහනම් වේ.


Congress of the United States
begun and held at the City of New-York, on
Wednesday the fourth of March, one thousand seven hundred and eighty nine

10 ඡායාරූපය ඇමරිකානු අයිතිවාසිකම් පනත

## 1.5.5 මානව අයිතීන් දිනා ගැනීමේ අරගල

අතීතයේ බිහිවූ සරල සමාජය ක්‍රමක්‍රමයෙන් සමාජය ප්‍රමාණයෙන් විශාල වීමත් සමග එහි සංකීර්ණත්වය වැඩිවිය. එකී සමාජ සංකීර්ණත්වය හේතුවෙන් මානව වර්ගයා ඉතිහාසය පුරාම ගැටුම් ඇති කර ගනු ලැබීය. ඒ අනුව මානව අයිතීන් දිනාගැනීමේ ඓතිහාසික විකාශය අරගලයන්ගෙන් ගහණවූ බව පෙනී යයි.

| සියවස | අරගලයන් |
|---|---|
| **18 සහ 19 වන සියවස** | වහල් සේවය ඇමරිකා එක්සත් ජනපදයේ තහනම් කිරීම. |
| **19 සහ 20 වන සියවස** | ඇමරිකාව හා යුරෝපයේ කාන්තා සම අයිතිය පිළිබඳ අවධානය යොමුවීම. |
| **18, 19 සහ 20 වන සියවස** | ඇමරිකාව, ආසියාව හා අප්‍රිකා රටවල වැඩ කරන ජනතාව විසින් වැඩි වැටුප් හා සේවක සුභ සාධනය වෙනුවෙන් සටන් කිරීම |
| **20 වන සියවස** | ලෝක යුද්ධ දෙකක් සමග සිදුවූ මිනිස් සංහාරය හා එයට විරුද්ධව අද අප අත්විඳින මානව හිමිකම් වර්ධනය වීම |

මෙම අරගල අද දක්වාම විවිධ ස්වභාවයෙන් පැවතියද, රට සාපේක්ෂව මානව හිමිකම් සඳහා වන තත්ත්වය විශ්වීය ස්වභාවයක් ගෙන ඇත.

## 2.0 මානව හිමිකම් යනු කුමක්ද ?

මානව අයිතීන් සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් විසින් විවිධ අර්ථ දැක්වීම් ඉදිරිපත් කර ඇත. එම නිසා මානව හිමිකම් සඳහා ස්ථිරසාර අර්ථ දැක්වීමක් දිය නොහැක. නමුත් මනුෂ්‍යයාගේ වටිනාකම් හා නෛසර්ගික වටිනාකම තුළින් මානව අයිතීන් නැමැති සංකල්පය බිහිවිය. එය සැමට සමානවත්, විශ්වීයවත් හිමිවන්නක් වන අතර අන්සතු කල නොහැක.

එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය මානව හිමිකම් යන්න දක්වන්නේ, මිනිසාගේ ජාතිකත්වය, උපන් ස්ථානය, හැදුනු වැඩුනු ස්ථානය, ලිංගිකත්වය, ජාතිය, සමේ වර්ණය, ආගම, භාෂාව හෝ වෙන ඕනෑම තරාතිරමක් නොමැතිව මිනිසුන් ලෙස උපත ලැබීම නිසාම නෛසර්ගිව උරුම වන්නක් ලෙසයි. අප සියළු දෙනාම කිසිදු වෙනස්කමකින් තොරව සමව මානව හිමිකම් භුක්ති විඳී. මේ සියළු අයිතීන් එකිනෙකට සම්බන්ධිත, එකිනෙක හා එක්ව යන බිඳිය නොහැකි අයිතීන් වේ. එය ගරුත්වයකින් යුතු මිනිසෙක් ලෙස ජීවත්වීමට ඇති අයිතියයි.

### 2.1 මානව හිමිකම් වල ස්වභාවය (ලක්ෂණ)

මානව හිමිකම් ගොඩනැගෙන්නේ මිනිස් ජීවිතයේ වටිනාකම හා ඔහු සතු ගෞරවය රැකගැනීමේ පසුබිම තුළයි.

- **මානව හිමිකම් විශ්වීය ස්වභාවයක් ගනියි.** (Universal)

ස්ත්‍රී, පුරුෂ භාවය, වයස, භාෂාව, ආගම හෝ ජාතිය වශයෙන් වෙනස් කොට සැලකීමකින් තොරව සෑමදෙනාටම මානව හිමිකම් භුක්ති විඳීමට හැකි විය යුතුය. එය පුද්ගලයා, දුප්පත් හෝ ධනවත් වුවත් ගෝත්‍රික වුවත් වෙනස් නොවිය යුතුය.

- **බෙදා වෙන්කළ නොහැකි බව** (Indivisible)

එක් අයිතිවාසිකමක් තවත් අයිතිවාසිකමකින් වෙන් කොට මායිම් කළ නොහැකි බව.

• එකක් අනෙක මත රඳා පැවතීම හා (Inter Dependent) එකිනෙක හා බැඳී පවතියි (Inter Related) මෙහි අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බවත් එකිනෙකා හා බැඳී පවතින බවත්ය.

• **මානව හිමිකම් අන්සතු කළ නොහැකිය** (Inalienable )
තමන් කැමති වුවත් පවරාදිය නොහැකි තමා තුළම පවතින්නකි. තමන් සතු මානව හිමිකම් අන්සතු කළ නොහැකි අනුල්ලංඝණීය අයිතියක් ලෙස හැඳින්විය හැකිය. ක්‍රියාකාරිත්වයේදී එක් අයිතිවාසිකමක් උල්ලංඝණය වුවහොත් සැමවිටම තවත් හිමිකම් රාශියක් ද බලපෑමට ලක් වේ. සෑම මානව අයිතිවාසිකමක්ම එක හා සමාන ලෙස වැදගත්වේ.

## 2.2 අයිතිවාසිකම් වර්ග කිරීම

මානව හිමිකම් පහසුවෙන් හඳුනා ගැනීමට සහ අවබෝධ කර ගැනීම සඳහා මානව හිමිකම් පර්යේෂකයන් සහ විද්වතුන් මෙම අයිතිවාසිකම් විවිධ පදනමින් වර්ගීකරණය කර ඇති බව පෙනී යයි.

### 2.2.1 පරම්පරාව අනුව

කැරල් වසක් (Karel Vasak) 1979 දී මානව හිමිකම් පරම්පරාව අනුව වර්ගීකරණයට ලක් කර ඇත.

**අ) පළවන පරම්පරාවේ අයිතිවාසිකම්**

නිදහස හා දේශපාලන ජීවිතයට ඇති අයිතිය එනම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සාකච්ඡා කරනු ලබයි.

උදා : කථා කිරීමේ නිදහස
සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
ආගමික නිදහස
ඡන්දය භාවිතයට ඇති අයිතිය

**ආ) දෙවන පරම්පරාවේ අයිතිවාසිකම්**

මුලිකවම ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් සාකච්ඡා කරනු ලබයි.

උදා : රැකියාවට ඇති අයිතිය
නිවාස සඳහා ඇති අයිතිය
සෞඛ්‍යාරක්ෂාවට ඇති අයිතිය
සමාජ ආරක්ෂාවට ඇති අයිතිය

**ඇ) තුන්වන පරම්පරාවේ අයිතිවාසිකම්**

මෙහිදී තනි පුද්ගල අයිතීන් නොවන සාමූහික අයිතිවාසිකම් සලකා බලයි. ඒ අනුව කණ්ඩායම් අයිතිවාසිකම් හා පොදු (සාමූහික) අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු කර ඇත.

උදා : ආරථික හා සමාජ සංවර්ධනට ඇති අයිතිය
සෞඛ්‍ය සම්පන්න පරිසරයකට ඇති අයිතිය
ස්වභාවික සම්පත් භුක්තිවිඳීමට ඇති අයිතිය
ස්වයංනිරණයට ඇති අයිතිය
සන්නිවේදනයට ඇති අයිතිය
සංස්කෘතික උරුමයන් සඳහා සහභාගී වීමට ඇති අයිතිය
සාමයට ඇති අයිතිය
සංවර්ධනයට ඇති අයිතිය

**ඈ) හතරවන පරම්පරාවේ අයිතිවාසිකම්**

තනි පුද්ගල හෝ සමාජ කණ්ඩායමක් පිළිබඳ නොව මානව වර්ගයාගේ සුභ සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට ඇති අයිතිවාසිකම් හතරවන පරම්පරාවේ අයිතිවාසිකම් ලෙස විද්වතුන් දක්වයි. මෙහිදී සම්පූර්ණයෙන්ම මානව දයාව පිළිබඳව විමසා බලයි.

## 2.2.2 ධනාත්මක අයිතිවාසිකම් සහ සෘණාත්මක අයිතිවාසිකම්

**අ) ධනාත්මක අයිතිවාසිකම්** (Positive Rights)

රජයක් හෝ රාජ්‍යයක් විසින් සහතික කර ලද අයිතිවාසිකම් ධනාත්මක අයිතීන් ලෙස හැඳින්වේ. මෙම අයිතිවාසිකම් වලට රජයේ හෝ රාජ්‍යයේ මැදිහත්වීම අවශ්‍යය. මෙයට සුභ සාධනය සම්බන්ධ අයිතිවාසිකම් ඇතුලත් වේ. එම අයිතිවාසිකම් නම්

- අධ්‍යාපනය
- ආර්ථික
- සමාජ ආරක්ෂාව
- රැකියා අවස්ථා

**ආ) සෘණාත්මක අයිතිවාසිකම්** (Nagative rights)

සමහර අයිතිවාසිකම් මිනිසුන් තුලම ඇත. එම අයිතිවාසිකම් සඳහා ඉල්ලීම් කිරීම අවශ්‍ය නොවේ. මෙම අයිතිවාසිකම් සඳහා රජයේ බලපෑමක් නොමැත. එමෙන්ම අයිතිවාසිකම් අධිකාරී බලයකින් තොරව වෙනත් ප්‍රභවයන් හරහා ඇති වී ඇත. මෙම අයිතීන් නම්

- අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
- දේපළ සඳහා ඇති අයිතිය
- ජීවත්වීමේ අයිතිය
- සමාගමයේ හා රැස්වීමේ අයිතිය
- ආගම් ඇදහීමේ අයිතිය

මෙම අයිතිවාසිකම් සියල්ල තනි පුද්ගල පරිපූර්ණ අයිතිවාසිකම් වේ.

### 2.2.3 තනිපුද්ගල අයිතිවාසිකම් සහ සාමූහික අයිතිවාසිකම්

**අ) තනිපුද්ගල අයිතිවාසිකම්** (Individual Rights)

ජෝන් ලොක්ට අනුව තනි පුද්ගලයා සතු වන අයිතිවාසිකම් නොබෙදිය හැකි අයිතිවාසිකම් වේ. එනම් එක් අයිතිවාසිකමක් තවත් අයිතිවාසිකමකින් වෙන් කළ නොහැකිය. තවද පුද්ගලයා සතු වන සම්ප්‍රදායන් මත සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පදනම් වී ඇත.

උදා : ආගමික අයිතිය
අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
ඡන්ද අයිතිය

**ආ) සාමූහික අයිතිවාසිකම්** (Collective Rights)

තුන්වන ලෝකයේ රටවල මූලික අයිතිවාසිකම් සාමූහික අයිතිවාසිකම් වේ. මන්ද මෙකී රටවල සමාජය සංස්කෘතිය, සම්ප්‍රදායන් සහ ආගම් මත බැඳී පවතී.

උදා÷ ළමා අයිතිවාසිකම්
කාන්තා අයිතිවාසිකම්

### 2.2.4 අයිතිවාසිකම් අයිතීන්වල ස්වභාවය අනුව වර්ග කිරීම

අයිතිවාසිකම් අයිතීන්වල ස්වභාවය අනුව කොටස් 5කට වර්ග කර දැක්විය හැකිය.

- සිවිල් අයිතිවාසිකම්
- දේශපාලන අයිතිවාසිකම්
- ආර්ථික අයිතිවාසිකම්
- සමාජීය අයිතිවාසිකම්
- සංස්කෘතික අයිතිවාසිකම්

## 3.0 ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් හා එහි වර්ධනය

## 3.1 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (UN Charter)

1939 සිට 1945 දක්වා II වන ලෝක යුද්ධය ලොව පුරාම ව්‍යාප්ත වන්නේ ලෝකයේ සෑම ජාතියක්ම බලාපොරොත්තු නොවන පරිදිය. යුද්ධය අවසන් වන විට යුරෝපයේ මෙන්ම ආසියාවේ බොහෝ නගර නටඹුන් වී තිබූ අතර මිලියන ගණනින් ජනතාව මිය ගොස් තිබූ අතර මිලියන ගණනක ජනතාවක් කුසගින්නේ හා නිවාස අහිමි වීමෙන් පීඩාවට පත්ව සිටින ලදී.



11 ඡායාරූපය : රටවල් 50ක නියෝජිතයන් සැන්ෆැන්සිස්කෝ නුවරදී හමුවීම

බලාපොරොත්තු සහ අරමුණු රාශියක් සමග 1945 අප්‍රේල් මාසයේදී රටවල් 50ක නියෝජිතයන් සැන්ෆ්‍රැන්සිස්කෝ නුවරදී හමුවන්නේ නැවත ලෝක යුද්ධයක් ඇති නොවිය යුතුය යන අදහස සමගිනි.

ජාත්‍යන්තර මානව හිමිකම් සඳහා වූ යාන්ත්‍රණය සඳහා එක්සත් ජාතින්ගේ සංවිධානය මහගු පසුබිමක් සපයයි. 1945 පටන් ජාත්‍යන්තර මානව අයිතින් සඳහා බලපාන සම්මුතීන් හා ප්‍රතිපාදන ගණනාවක් මගින් මානව හිමිකම් සඳහා නීතිමය පදනම තහවුරු කර ඇත.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 1(3) ප්‍රකාරව ආර්ථිකමය, සමාජමය, සංස්කෘතිකමය මානුෂවාදී ජාත්‍යන්තර ප්‍රශ්න විසඳීමේදී ජාත්‍යන්තර සහයෝගිතාවයේ අවශ්‍යතාවයත්, ආගම, භාෂාව, ජාතිය හෝ ලිංගිකත්වය පදනම් කර නොගැනීමත් තුළින් ජාත්‍යන්තර මානව හිමිකම් හා නිදහස තහවුරු කිරීමටත් කටයුතු කල යුතුය. 55 වන වගන්තිය පවසන්නේ එක්සත් ජාතීන් විසින් විශ්වීය අයිතීන් තහවුරු කිරීමටත් කටයුතු කල යුතු බවයි.

එක්සත් ජාතීන් මෙම මානව හිමිකම් පිළිබඳ සදාචාරාත්මක නීති තත්ත්වය ජාතීන් නෛතිකව බැඳීමේ තත්ත්වයකට වෙනස් කිරීම සඳහා දිගින් දිගටම මහන්සිවේ. එය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, විවිධ ගිවිසුම්, ප්‍රඥප්තීන්, ප්‍රතිමානයන්, සංකල්ප මගින් මෙන්ම සදාචාරාත්මක නීතිය තුළින් ද මතු කර ගත හැක.

## 3.2 මානව හිමිකම් විශ්ව ප්‍රකාශය

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අලුතින් පිහිටුවා ගත් මානව හිමිකම් කොමිසමට මානව හිමිකම් ලේඛන සකස් කිරීමේ කාර්ය භාරය පවරනු ලැබීය. මෙම කාර්යයේ ප්‍රධානියා වූයේ එලියානෝ රූස්ට්වෙල් මහත්මියයි. ඇයගේ මූලිකත්වයෙන් යුතුව රටවල් 18ක නියෝජිතයන් එකතු වී මෙහි කටයුතු කර ගෙන යන ලදී. එහිදී සකස් කරනු ලැබූ ලේඛනය 1948 දෙසැම්බර් 10 වන දින පැවති එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේදී මානව හිමිකම් විශ්ව ප්‍රකාශය යනුවෙන් පිළිගන්නා ලදී.

මිනිස් පවුල සතු විය යුතු නෛසර්ගික ගෞරවය ආරක්ෂා කර ගැනීම, නිදහස, යුක්තිය හා සාමය යන සියල්ලෙහි පැවැත්ම ආරක්ෂා කරන බව මෙමගින් පිළිගැනුණි. 20 වන සියවසේ දී සකස් කරනු ලැබූ අති විශේෂ ලේඛනයක් ලෙස මෙය පිළිගනු ලැබේ. මෙම ලේඛනයට ලෝකයේ සියලු මානව හිමිකම් ප්‍රමිතීන් ඇතුලත් කර ඇති බවට සැමදෙනාගේම පිළිගැනීම වේ.

මානව හිමිකම් විශ්ව ප්‍රකාශය අන්තර් ජාතික සාදාචාරාත්මක නීතියේ

අංගයක් ලෙස සැලකේ. එය වගන්ති 30 කින් සමන්විත වන අතර, පුද්ගලික ආරක්ෂාව, නීති සංග්‍රහ සහ නිදහස වැනි අයිතීන් සුරක්ෂිත කර ඇත. මේ තුල ඇති අයිතිවාසිකම් ජනතාවට භුක්ති විදීමට හැකිය. මන්ද සෑමදෙනාම නිදහස්ව සහ සමානාත්මතාවයෙන් යුතුව ඉපිද ඇත. මෙම ප්‍රකාශනයට නීතිමය බැදීමක් නැති වුවත් දේශපාලන සහ සදාචාරාත්මක පදනමින් ඉතා වැදගත් ලේඛනයක් ලෙස සලකනු ලැබේ.




12 ජායාරූපය : එලියානෝ රූස්වෙල් මහත්මිය සහ මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය

තවදුරටත් මෙම ප්‍රකාශනය මානව හිමිකම් මිණුම් දණ්ඩක් ලෙස පිළිගෙන භාවිතා කරනු ලබන බව දැක්විය හැකිය. මෙම ප්‍රකාශනයේ සඳහන්ව ඇති අයිතිවාසිකම් ජාත්‍යන්තර ගිවිසුම්, කලාපීය මානව හිමිකම් ලේඛන වලට සහ දේශීය වශයෙන් හමුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට හා නීති වලට ඇතුලත් කර ඇත. එපමණක් නොව දේශීයව සහ ජාත්‍යන්තර නඩු තීන්දුවලදීත් මෙම ප්‍රකාශනයේ අයිතීන් සලකා බලා ඇත.

මෙම ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම් පහත වගු අංක 1හි ලුහුඩින් දක්වා ඇත. (අයිතීන් විස්තරාත්මකව ඇමුණුම් 1 හි දක්වා ඇත)

වගු අංක 1 - මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ සාරාංශය

| වගන්තිය | අයිතිවාසිකම |
|---|---|
| 1 - 2 | ගෞරවය, නිදහස, සමානාත්මතාවය සහ සහෝදර ප්‍රේමය |
| 3 - 11 | පුද්ගලයන්ගේ අයිතීන් - ජීවත්වීමේ අයිතිය, වහල් සේවය තහනම් කිරීම |
| 12 - 17 | සිවිල් හා දේශපාලනික සමාජයක තනි පුද්ගල අයිතිවාසිකම් |
| 18 - 21 | ආගමික, ප්‍රජා සහ දේශපාලන නිදහස- ආගමික නිදහස, රැස්වීමේ නිදහස |
| 22 - 27 | සමාජීය, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් - අධ්‍යාපනය, ජීවන තත්ත්වය, වැඩ කිරීම |
| 28 - 30 | පුද්ගලයන්ගේ සමාජමය යුතුකම් |

## 3.3 එක්සත් ජාතීන්ගේ ගිවිසුම්
## (සම්මුතීන්, ප්‍රඥප්තීන්, මුල් කෙටුම්පත්, එකඟතාවන්, ගිවිසුම්)

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ සඳහන් අරමුණු මුදුන් පමුණුවාලීම වෙනුවෙන් පසුකාලීනව එක්සත් ජාතීන් විසින් අන්තර්ජාතික සම්මුතීන්, ප්‍රඥප්තීන් රාශියක් සම්පාදනය කරන ලදී. එයට අමතරව ප්‍රධාන සම්මුතියට අදාළව වෛකල්පිත සන්ධාන ද සකස් කරනු ලැබීය.

මෙකී සම්මුතින්, ප්‍රඥප්තීන් පිළිබඳ නීත්‍යානුකූල බැඳීමක් එකී සම්මුතීන්හි පාරශවකාර රාජ්‍යයන්ට ඇති වේ.

ජාත්‍යන්තර ගිවිසුමක් යනු සුවිශේෂී රීතීන් කිහිපයකට අනුකූලවීමට යටත්ව රාජ්‍යයන් විසින් ස්වෙච්ඡාවෙන් ඇති කර ගන්නා එකඟතාවයන්ය. මානව හිමිකම් වලට අදාල ප්‍රමුඛ පෙළේ අන්තර ජාතික ගිවිසුම් 09 ක් පෙන්වා දිය හැක.

වගු අංක 2 හි එකී අන්තර්ජාතික ගිවිසුම් සම්මත වූ දිනය හා ශ්‍රී ලංකාව එම ගිවිසුම් අපරානුමත කිරීම සම්බන්ධව සඳහන් කොට ඇත.

වගු අංක 2 - අන්තර්ජාතික ගිවිසුම් සම්මත වූ දිනයන් හා ශ්‍රී ලංකාව අපරානුමත කිරීම

| ගිවිසුම | කෙටි නාමය | දිනය | ශ්‍රී ලංකාවේ සම්මතවීමේ තත්ත්වය |
|---|---|---|---|
| සියළුම ආකාරයේ වාර්ගික අසමානතා පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය | **ICERD** | 1965.12.21 | 1982.02.18 |
| සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය | **ICCPR** | 1966.12.16 | 1980.06.11 |
| සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ පළමු වෛකල්පිත සන්ධානය | **ICCPR OP - 01** | 1966.12.16 | 1997.10.03 |
| මරණීය දණ්ඩනය තහනම් කිරීමේ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ සම්මුතියේ දෙවන වෛකල්පික සන්ධානය | **ICCPR OP - 02** | 1966.12.16 | අපරානුමත කර නැත |
| ආර්ථික, සංස්කෘතික හා සමාජ අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය | **ICESCR** | 1966.12.16 | 1980.06.11 |
| ආර්ථික, සංස්කෘතික හා සමාජ අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතයේ වෛකල්පික සන්ධානය | **ICESCR OP** | 2008.12.19 | අපරානුමත කර නැත |
| කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස්කොට දැක්වීම් වැලැක්වීමේ සම්මුතිය | **CEDAW** | 1979.12.18 | 1981.10.05 |
| කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස්කොට දැක්වීම වැලැක්වීමේ සම්මුතියේ වෛකල්පික සන්ධානය | **CEDAW OP** | 1999.12.10 | 2002.10.15 |
| කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ සම්මුතිය | **CAT** | 1984.12.10 | 1994.01.03 |

| | | | |
|---|---|---|---|
| කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ සම්මුතියේ වෛකල්පික සන්ධානය | **CAT-OP** | 2002.12.18 | අපරානුමත කර නැත |
| ළමා අයිතිවාසිකම් සම්මුතිය | **CRC** | 1989.11.20 | 1991.07.12 |
| අවි ගැටුම් හි ළමා සහභාගිත්වයට අදාළව ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පික සන්ධානය | **CRCAC-OP** | 2000.05.25 | 2000.09.08 |
| ළමයින් විකිණීම, ළමා ගණිකා සේවය හා ළමයින් අසභ්‍ය රූප හා වීඩියෝ සඳහා යොදාගැනීමට අදාළව ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පික සන්ධානය | **CRCSC OP** | 2000.05.25 | 2006.09.22 |
| විදේශික කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් සඳහා වන අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය | **ICRMW** | 1990.12.18 | 1996.03.11 |
| බලෙන් පුද්ගලයන් පැහැරගෙනයාම වැලැක්වීමට අදාල අන්තර් ජාතික සම්මුතිය | **CED** | 2006.12.20 | අපරානුමත කර නැත |
| ආබාධිත පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ සම්මුතිය | **CRPD** | 2006.12.13 | 2007.03.30 අත්සන් කර ඇත |
| ආබාධිත පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ සම්මුතියේ වෛකල්පික සන්ධානය | **CRPD -PO** | 2006.12.12 | අපරානුමත කර නැත |

### 3.3.1 සියළු ආකාරයේ වාර්ගික අසමානතා පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (1965)

පළමු වගන්තිය මගින් වාර්ගික වෙනස්කොට සැලකීම් යනු කුමක්දැයි නිර්වචනය වේ. එනම්, යමෙකුගේ ජාතිය, වර්ණය, ජන්මය, ජාතිකත්වය හෝ වර්ගය, සම්භවය පදනම් කර ගනිමින් යමෙකු වෙනස් කොට දක්වයිද, ඔහු හෝ ඇය වෙන් කරයිද, සීමාවකට යටත් කරයිද, හෝ විශේෂ සැලකිල්ලකට භාජනය කරයිද, එම තත්ත්වය වෙනස් කොට සැලකීමක් ලෙස හැඳින්වේ. තවද, එමගින් යමෙකු තම දෛනික ජීවිතයේදී භුක්තිවිඳින දේශපාලන, ආර්ථික, සමාජමය හා සංස්කෘතිකමය සම අයිතියක් උල්ලංඝනය වේද එය යටපත් වේද එවැනි තත්ත්වයක් වෙනස්කොට සැලකීමකි.

සම්මුතියට අදාල පාර්ශවයන් පහත කාරණා සඳහා එකග වී ඇත.

- සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජමය හා සංස්කෘතික වෙනස්කොට සැලකීම් පිටුදැකීම
- වාර්ගික වෙනස්කොට සැලකීමකට විරුද්ධව සියළුම ආකාරයේ ප්‍රතිඵලදායි සහන ජාතික හා රාජ්‍ය ආයතන ප්‍රධානත්වයෙන් ලබාදීම
- පුද්ගලයන් විෂයෙහි, කණ්ඩායම් වලට සහ ආයතන වලට වාර්ගික වෙනස් කොට සැලකීමේ අවශ්‍යතාවන්ට මැදිහත් නොවී සිටීමට වගබලා ගැනීම
- රාජ්‍ය හා දේශීය ප්‍රතිපත්තීන් හා නීතින් යාවත්කාලීන සුපරීක්ෂණය, සංශෝධනය හෝ වෙනස් කිරීම

### 3.3.2 සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)

මෙම සම්මුතිය මගින් රාජ්‍යයන් හි පාරම්පරික වගකීම්, යුක්තිය පසිඳලීම හා නීතියේ ආධිපත්‍යය යන්න අවධානයට ලක් කරයි. මෙහි එන බොහෝමයක් වගන්ති පුද්ගලයන් හා රාජ්‍ය අතර ඇති සබඳතාවය දක්වයි.

සිවිල් හා දේශපාලන අයිතීන් :

- ස්වයං තීරණ අයිතිය
- ජීවත්වීමේ අයිතිය, නිදහස හා ආරක්ෂාව
- යාමේ ඊමේ නිදහස
- අදහස් ප්‍රකාශ කිරීමේ, හෘදය සාක්ෂියේ හා ආගමික නිදහස
- සාමකාමී ජනරාශිය හා රැස්වීමේ නිදහස
- වදහිංසාවෙන් වැලකීමේ අයිතිය
- වහල්භාවයෙන්, ශ්‍රම සූරාකෑමෙන්, අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම හා රඳවා තබා ගැනීමෙන් වැලකීමේ නිදහස
- සාධාරණ හා කඩිනම් නඩු විමසීම් හා පෞද්ගලිකත්වයේ අයිතිය

මෙම සම්මුතියට අදාලව වෛකල්පික සන්ධාන දෙකක් ඇත. පළමු වෛකල්පික සන්ධානය මගින්, මෙම සම්මුතියේ සඳහන් වගන්තියක් උල්ලංඝනය කරමින් මානව හිමිකම් උල්ලංඝනයකට ලක්වන වින්දිතයන් සමග කටයුතු කිරීමට අදාලව කාර්ය පටිපාටිමය විධිවිධාන සඳහන් වේ. දෙවන වෛකල්පික සන්ධානය මගින් මරණීය දණ්ඩනය තහනම් කර ඇත.

## 3.3.3 ආර්ථික, සංස්කෘතික හා සමාජ අයිතීන් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (1966)

අන්තර ජාතික ප්‍රජාව හා අන්තරජාතික නීතිය විසින් ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් මැනවින් පිළිගන්නා අතර ඒවා අවධානය දිනාගනිමින් ඉදිරියටත් වර්ධනය වේ.

ආර්ථික, සමාජ හා සංස්කෘතික වශයෙන් සුවිශේෂි වන අයිතීන් ගණනාවක් මෙම සම්මුතියේ අන්තරගත වේ. ඒ අතර,

- සාධාරණ හා සුදුසු පරිසරයක රැකියාවක් කිරීමට,
- සමාජ රැකවරණයට,
- ප්‍රමාණවත් ජිවන තත්ත්වයක් ලැබීමට,

- උපරිම වශයෙන් අත්කර ගත හැකි පිවන තත්ත්වයක් ලැබීමට,
- අධ්‍යාපන හා සංස්කෘතිකමය මෙන්ම විද්‍යාත්මක දියුණුව හා නිදහස භුක්ති විඳීමට අයිතිය තිබිය යුතුය.

## 3.3.4 කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස් කොට සැලකීම් වැලැක්වීමේ සම්මුතිය (1979)

මෙකී සම්මුතියේ ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් යනු ස්වකීය විවාහක තත්ත්වය නොසලකා ස්ත්‍රී පුරුෂ (පුම්තිරි) සමානාත්මතාව පිළිබඳ පදනමක් මත දේශපාලන ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් පිළිගැනීම' භුක්ති විඳීම හෝ භාවිතය බාධා කිරීම හෝ නිෂ්ප්‍රභා කිරීම ප්‍රතිඵලය හෝ පරමාර්ථය කොටගත් ස්ත්‍රී පුරුෂ භේදය මත පදනම් වූ කවරාකාරයක හෝ විභේදනය, නිශේධනය හෝ සීමා කිරීම හෝ වන්නේය. [8]

මෙම සම්මුතිය මගින් ලොව පුරා කාන්තාවන්ට දිගින් දිගටම සිදුවන සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම් වැලැක්වීම අරමුණු කරගෙන ඇත. මෙමගින් කාන්තාවන්ගේ සාමාන්‍ය පීවිතය, විවාහය, පවුල් පීවිතය හා ඔවුන්ව ලිංගිකව සූරාකෑම පිළිබඳව අවධානය යොමු කර ඇත.

මෙම සම්මුතියට එකඟ වූ රාජ්‍යයන් විසින්,

- කාන්තාවන් හා පුරුෂයන්ගේ සාධාරණත්වයට අදාල මූලික ගුණාංග ජාතික ව්‍යවස්ථා ප්‍රතිපාදන සමග එකතු කිරීමටත්,
- ව්‍යවස්ථාමය හා අනිකුත් ප්‍රතිපාදන සැපයීමටත්, අවශ්‍යතාවය මත කාන්තාවන් වෙනස් කොට සැලකීම් ලබන අවස්ථාවන් හිඳී සීමාකිරීම් පැනවීමටත්,
- ඒවා ජාතික අධිකරණ පද්ධතිය සහ රාජ්‍ය ආයතන හරහා කාන්තාවන් ආරක්ෂා කර ගැනීමේ අටියෙන් මැනවින් ක්‍රියාත්මක කිරීමටත්,
- පුද්ගලික පිවිතයේදී කාන්තාවන්ට සිදුවිය හැකි වෙනස් කොට සැලකීම් වෙතොත් ඒවායින් වැලකීමටත් එකඟවී ඇත.

[8] කාන්තාවන්ට සිදු වන සියළුම ආකාරයේ වෙනස් කොට දැක්වීම් වැලැක්වීමේ සම්මුතිය - 1 වන වගන්තිය

## 3.3.5 කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය විමෙන් වැලකී සිටීමේ සම්මුතිය (1984)

වධහිංසාව යනු කිසියම් තැනැත්තකුගෙන් හෝ තුන්වන පාර්ශවයකින් තොරතුරු හෝ පාපෝච්චාරණයක් ලබා ගැනීම, යම් තැනැත්තකු හෝ තුන්වන පාර්ශවයක් විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි සැක කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා එම තැනැත්තාට දඬුවම් කිරීම, යම් ආකාරයක වෙනස්කම් දැක්විමක් මත පදනම් වූ හේතුවක් නිසා ඔහුට හෝ තුන්වන පාර්ශවයකට තර්ජනය හෝ බලහත්කාරකම් වැනි ක්‍රියා මගින් ශාරීරික හෝ මානසික වශයෙන් තදබල වේදනාකාරී හෝ හිංසාකාරී ක්‍රියාවක්, රාජ්‍ය නිලධරයකු හෝ නිල තත්ත්වයෙන් ක්‍රියා කරන වෙනත් තැනැත්තකුගේ ඉල්ලීම පිට හෝ කැමැත්ත ඇති හෝ අනුදැනුම ඇතිව එම තැනැත්තා වෙත සිදු කරනු ලබනවිට, එම ක්‍රියාව අදහස්වේ.[9]

මෙමගින් අපේක්ෂිත අරමුණ වුයේ මිනිසුන් වධහිංසාවන්ට ලක්වීම වැලැක්විමත් මිනිසුන් බේරාගැනීමත්, ඒවා තහනම් කිරීමත්, එමගින් නිර්මාණය වන වින්දිතයන් සඳහා සුදුසු ප්‍රතිකර්මයන් ලබාදීම ශක්තිමත් කිරීමත්ය.

සම්මුතිය මගින් එකග වූ රාජ්‍යයන් විසින්,

- අපරාධ වගකීම් පැවරීමේ ක්‍රමවේදයේ සිට සියළු ආකාරයේ වධහිංසාවන් වැලැක්වීමට,
- වින්දිතයන් හා වුදිතයන් සමග කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් අතර මානව හිමිකම් වලට ගරු කිරීමේ වැදගත්කම වර්ධනයට,
- අපක්ෂපාතිව හා ක්ෂණිකව වධහිංසා වලට අදාල පැමිණිලි විභාගයටත් කටයුතු කල යුතුය.

## 3.3.6 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989)

ළමා අයිතිවාසිකම් සම්මුතියේ 1 වන වගන්තියට අනුව ළමයකු යන්නෙන්, එම ළමයාට අදාළ නීතිය යටතේ වයස අවුරුදු 18ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකු ම අදහස් වේ.

---

[9] කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ සම්මුතිය -1 වන වගන්තිය

මෙම සම්මුතියතුළ ළමා අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීමෙහිලා මග පෙන්වන මූලික මූලධර්ම 4 ක් අන්තර්ගත වේ.

- වෙනස් කොට නොසැලකීම
- දරුවාගේ උපරිම සුභ සිද්ධි
- ජීවත්වීම, ජීවිතය පවත්වාගෙනයාමට සහ සංවර්ධනයට ඇති අයිතිය
- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

මෙම සම්මුතියේ පාර්ශවකරුවන් විසින්

- නිදහස හා අනිවාරය ප්‍රාථමික අධ්‍යාපනයක් සැපයීමට
- ආර්ථික සූරාකෑම්, ලිංගික අපයෝජනය, කායික හා මානසික හානි නොසලකා හැරීම් වලින් ආරක්ෂා කිරීමට
- ආබාධිත දරුවන් කෙරෙහි අවධානයක් යොමු කිරීමටත්, ඔවුන්ට විශේෂ සත්කාර හා අධ්‍යාපනයක් ලබාදීමටත්
- යුධමය අරගල වලින් බලපෑමට ලක්වූ දරුවන් ආරක්ෂා කිරීමට,
- ළමා ගණිකා වෘත්තියේ යෙදවීම, අසභ්‍ය දෑ සඳහා යෙදවීමෙන් වැලැකීමට එකග වි ඇත.

මෙම සම්මුතියට වෛකල්පිත සන්ධානයන් 2 කි.

ඉන් එකක් දරුවන් යුධමය අරගල වලට සම්බන්ධවීම පිළිබඳව සඳහන් වන අතර, අනෙක් දරුවන් විකිණීම, ළමා ගණිකා සේවයේ හා අසභ්‍ය දෑ වලින් වලක්වාලීම පිළිබඳව දක්වයි.

### 3.3.7 සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය (1990)

මිනිසුන් සාමාන්‍යයෙන් ආයුධ සන්නද්ධ ගැටුම්, විටින් විට ඇතිවන පීඩාවන්, ස්වභාවික විපත් හා දුගීකම හේතුවෙන් සංක්‍රමණය කිරීම සිදු කරයි. මිලියන ගණන් මිනිසුන් සංක්‍රමණික සේවකයන් ලෙස විවිධ රටවල ජීවත් වේ.

මෙම සම්මුතියේදී සංක්‍රමණික සේවකයා යන පදයෙන් අදහස් වන්නේ ඔහු හෝ ඇය ජාතිකයන් නොවන රාජ්‍යයක ගෙවීමක් ලබන ක්‍රියාකාරකමක යෙදී සිටි හෝ යෙදී සිටින හෝ යොදවනු ලැබිය හැකි පුද්ගලයෙකි.[10]

මෙම සම්මුතිය සංක්‍රමණය සඳහා සූදානම් වීම, පිටත්ව යාම, අතර මැද නැවතුම හා නැවතී සිටින හා ගෙවීමක් ලබන සේවා තත්ත්වයක සිටින මුළු කාලය පුරාම මෙන්ම හා උපන් රාජ්‍යයට හෝ සුපුරුදු වාසස්ථානය පවතින රාජ්‍යයට ආපසු  පැමිණීම ඇතුළත් වන සංක්‍රමණ සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ හෝ සම්පූර්ණ සංක්‍රමණ කාලය තුළම බල පැවැත්වේ.

සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයන් විසින්,

- සත්කාරක රටවල් වල සිටින තම ජාතිකයන්ට සාධාරණ වැඩ කිරීමේ තත්ව ලබාදීමටත්,
- වෘත්තීය සමිතීන්ට බැඳීමටත්,
- සමාජ ආරක්ෂණය, හදිසි සෞඛ්‍යාරක්ෂණය,
- සංක්‍රමණ පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම,
- සේවා යෝජකයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමට සහ රැකියා නියුක්තිකයන්ට තම පවුල් වල සාමාජිකයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමට සහාය දීමට,
- සත්කාරක රටේ නීතියට පටහැනි නොවීමටත් එකඟ වී ඇත.

## 3.3.8 පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (2006)

මෙම සම්මුතියේ සඳහන් බලහත්කාර අතුරුදහන් කිරීමක් යනු රජයේ නිලධාරීන්, රජයේ බලය, සහයෝගය හෝ එකඟත්වය මත කටයුතු කරන ඕනෑම පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන අත් අඩංගුවට ගැනීමක්, රඳවා තබා ගැනීමක් පැහැර ගැනීමක් හෝ ඕනෑම ආකාරයක නිදහස අහිමි කිරීමක දී අතුරුදහන් වූ පුද්ගලයා පිළිබඳ තොරතුරු සඟවා තැබීම, නීතිමය සුරක්ෂිතතාවයකින් පිටත ස්ථානයක එකී පුද්ගලයා රඳවා සිටීම පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම අදහස් වේ.[11]

---

[10] සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය  -1 වගන්තිය

[11] පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය -2 වගන්තිය

මෙමගින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට භාජනය නොවී සිටීමේ අයිතිය මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව ඥාතීන්ට සත්‍ය තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය පිළිබඳව සටහන් කර තිබේ.

සම්මුතිය තුළ මෙම අපරාධ නිවාරණය, දණ්ඩන පිළිබඳවත්, බලපෑමට ලක්වූ පුද්ගලයන් හා ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් සහ සිර භාරයේ සිටින කාලය තුළ ඉපදුනු දරුවන් වැරදි සහගත ලෙස බැහැර කිරීම පිළිබඳව අන්තරගත වේ. මෙම සම්මුතිය යටතේ අන්තර් ජාතික සහයෝගිතාවය පිළිබඳව පාර්ශවකාර රාජ්‍යයන්ට පවතින බැඳියාව ද අවධාරණය කරයි.

## 3.3.9 ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (2006)

මෙම සම්මුතිය තුළ ආබාධිතයන් ඇතුළු සියළු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හඳුනාගනී. මෙම සම්මුතිය තුළින් ආබාධිත පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවරධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ශක්‍යතාවක් පිරිනමා ඇත. ආබාධිතයන්ගේ සාමාජීය හා මනුෂ්‍ය අයිතීන් පිළිබඳ ආදර්ශයක් සම්මුතිය මගින් ගැබ් කොට, මෙහි තුන්වන වගන්තිය මගින් වඩා හොඳින් සපුරාගැනීමට හැකි පදනම් මූලධර්ම රැසක් හඳුනාගෙන තිබේ. ඒවා නම්,

- නෛසර්ගික අභිමානය, තීරණයක් ගැනීමට තනි පුද්ගලයෙකුට පවතින ස්වායක්තාවය සහ නිදහස් පුද්ගලයන්ට ගරු කිරීම,
- වෙනස් කොට නොසැලකීම,
- සමාජය තුළ පූර්ණ කාර්යක්‍ෂම සහභාගිත්වය,
- ආබාධිත පුද්ගලයන්ට ගරු කිරීම හා මානව විවිධත්වයේ සහ මනුෂ්‍යත්වයේ කොටසක් ලෙසින් ඔවුන් පිළිගැනීම,
- සමාන අවස්ථාවන්,
- ප්‍රවේශය,
- කාන්තාවන් හා පුරුෂයන් අතර සම්බන්ධතාවය
- ආබාධිත දරුවන්ගේ දුක්ගැනවිලි වලට අවධානය යොමු කිරීම හා ඔවුන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කර ගැනීමට ඇති අයිතියට ගරු කිරීම

## 3.4 එක්සත් ජාතීන්ගෙන් බැහැර වූ ගිවිසුම්

### 3.4.1 රෝම ව්‍යවස්ථාව

රෝම ව්‍යවස්ථාව මගින් දරුණු ගණයේ අපරාධ හතරක් හඳුනාගෙන තිබෙන අතර, අන්තර්ජාතික අපරාධ අධිකරණය පිහිටුවා මෙම අපරාධ වලට චෝදකයන් හඳුනාගැනීම සිදුකරයි. රෝම ව්‍යවස්ථාව අන්තර්ජාතික නීතියෙන් බැඳේ.

- වර්ග ඝාතනය
- මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ
- යුධ අපරාධ
- ආරවුල් සම්බන්ධ අපරාධ[12] මෙහි දි සලකා බලයි.

### 3.4.2 ජිනීවා සම්මුතිය

ජිනීවා සම්මුතිය හා වෛකල්පික සන්ධාන ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලයන් වේ. මෙය සන්නද්ධ අරගල නියමානුකූල තත්ත්වයට පත් කරන අතර ම්ලේච්ඡ යුද්ධයන් සීමා කිරීම් වලට ලක් කෙරේ. තවද ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව මානුෂවාදී පදනමින් යුතුව කටයුතු කල යුතු බව සඳහන්ව ඇත. මෙය ප්‍රධාන වශයෙන් මනුෂ්‍ය ගරුත්වයට සෑම අවස්ථාවකදීම ගෞරව කල යුතු බව සඳහන් කරයි.

තවද සන්නද්ධ අරගල වලදී කිසිවකු කිසිම වෙනස්කමකට ලක් නොකළ යුතු අතර සෑම මනුෂ්‍යයෙකුටම උපකාර කිරීමේ වගකීම පාර්ශවයන් සතු වේ. එමෙන්ම තුවාල ලබන වේදනා විඳින සෑම මනුෂ්‍යයෙකුටම අවශ්‍ය සහනයන් සැපයීම ද පාර්ශවකාර රාජ්‍යයන්හි වගකීමය.

ජිනීවා සම්මුතිය සන්ධාන හතරක් හා වෛකල්පික සන්ධාන තුනකින් සමන්විත වේ. යුධමය හා අරගල අවධීන් හීදී සිවිල් වැසියන්ට අමානුෂිකව සැලකීම සම්බන්ධයෙන් අන්තර්ජාතික නීතිය හා සබැඳේ.

[12] 5(1) වන වගන්තිය - රෝම ව්‍යවස්ථාව

| | |
|---|---|
| **1 වන සම්මුතිය** | යුධ පිටියේ තුවාල වූ හා රෝගී වූ, යුධ හමුදා භටයන්ගේ තත්ත්වය දියුණු කිරීම සහ ආරක්‍ෂා කිරීම |
| **2 වන සම්මුතිය** | මුහුදේ තුවාල වූ, රෝගී වූ සහ මුහුදුබත් වූ නැව්වල හමුදා භටයන්ගේ තත්ත්වය දියුණු කිරීම සහ ආරක්‍ෂා කිරීම |
| **3 වන සම්මුතිය** | යුද්ධ සිරකරුවන් සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය |
| **4 වන සම්මුතිය** | යටත් කර ගත් ප්‍රදේශ තුල සිටින පොදු ජනතාව ආරක්‍ෂා කිරීම |
| **පොදු වගන්තිය 3** | ජිනීවා සම්මුතීන් හතරටම පොදුය. මෙහි ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගල ගැන සඳහන් කරයි. |
| **1 වන වෛකල්පික සන්ධානය** | ජාත්‍යන්තර සන්නද්ධ අරගල ගැන සඳහන් කරයි |
| **2 වන වෛකල්පික සන්ධානය** | ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගල ගැන සඳහන් කරයි |
| **3 වන වෛකල්පික සන්ධානය** | විශේෂිත සංකේත ගැන සඳහන් කරයි |

## 3.5 මානුෂවාදී නීතිය හා මානව අයිතිවාසිකම් නීතිය අතර සම්බන්ධය

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යුධමය ගැටුම් වලදී අදාළ වේ. යුධ ගැටුම් වලදී බලපෑමට ලක්වූ තැනැත්තන් දේපළ ආරක්ෂා කිරීමත් ගැටුම් වලට මැදිවූ පුද්ගලයන්ගේ සුභ සාධනයත් සලකා බලයි. ජිනීවා හා හේග් සම්මුතීන් මීට අදාල වේ.

මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිය විසින් රජය තනි පුද්ගල අයිතිවාසිකම් තහවුරු කිරීමෙහි ලා ක්‍රියා කල යුතු අන්දම හා එහි ලා තනිපුද්ගයා සතු කාරය භාරය පිළිබඳව නියමයන් දක්වන අතර, මානුෂවාදී නීතිය, යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සහ සරණාගතයන් බවට පත්වූවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් හා යුද්ධය පවත්වාගෙන යා යුතු අන්දම පිළිබඳ දක්වයි.

මානුෂවාදී හා මානව අයිතිවාසිකම් යන නීති දෙකම ජීවිත, සෞඛ්‍ය, තනිපුද්ගල ආත්මාභිමානය ආරක්ෂා කිරීමට මහත් පරිශ්‍රමයක් දරයි. අන්තර්ජාතික මානුෂීය නීතිය ආදේශ කරන්නේ යුධමය අරගල වලදීය. අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සෑම අවස්ථාවකදීම ආදේශ වේ.

## 4.0 කළාපීය මානව හිමිකම් වලට අදාල ප්‍රමිතීන් හා ඒවායේ වර්ධනය

කලාපීය වශයෙන් මානව හිමිකම් තත්ත්වය යහපත් කිරීමට යම් යම් ක්‍රමෝපායන් ගණනාවක් යොදාගෙන ඇත. මේවා කලාපීය වශයෙන් සුවිශේෂී වේ. මෙයින් කිහිපයක් පහත සඳහන් වේ.

## 4.1 මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතිය (1953)

යුරෝපය තුල මානව හිමිකම් හා මූලික නිදහස ආරක්ෂා කිරීමට අදාළ ජාත්‍යන්තර සම්මුතියකි. මෙම සම්මුතිය යුරෝපය තුල මානව හිමිකම් වර්ධනය හා දැනුම ලබා දීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මෙම සම්මුතිය මගින් මානව හිමිකම් පිළිබඳ යුරෝපියානු අධිකරණය පිහිට වූ අතර සම්මුතියට අදාළව තම අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව සිතන ඕනෑම අයෙකුට මෙම අධිකරණය මගින් සහන ලබා ගත හැකිය.

## 4.2 යුරෝපීය සමාජ සම්මුති පත්‍රය (1961)

යුරෝපා කවුන්සිලය මගින් 1961 දී බිහිකල අතර 1996 දී එය සංස්කරණය කරනු ලැබීය. එය 1999 දී ක්‍රියාත්මක විය. පාර්ශවකාර රාජ්‍යයන්හි මානව හිමිකම් හා නිදහස පිළිබඳව විමසීම සඳහා ක්‍රමවේදයක් මෙම සාධන පත්‍රය මගින් සකස් කර ඇත.

මෙම සාධන පත්‍රයෙන් ප්‍රකාශිත මූලික අයිතිවාසිකම් කිහිපයක් නම්

- නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපන සහ කම්කරු අයිතිය, සමාන වැඩට සමාන වැටුප්, සමාජ ආරක්ෂාව සහ නීතිමය ආරක්ෂාව, සමානාත්මතාවය, සංක්‍රමණික සේවක අයිතීන්, ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වේ.

## 4.3 කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ යුරෝපා සම්මුතිය (1987)

මෙම සම්මුති මගින් වධහිංසාව වැළැක්වීම සම්බන්ධයෙන් කමිටු පිහිටු වීමට ප්‍රතිපාදන ඇති අතර මෙම කමිටුවලට රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීම සඳහා අධිකරණ බලය ඇත.

## 4.4 මානව හිමිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතිය (1969)

මෙය සැන් ජෝස් ගිවිසුම (Pact of San Jose) නමින්ද හඳුන්වයි. මෙම සම්මුතියේ අරමුණු නම් පෞද්ගලික නිදහස සහ සමාජ යුක්තිය පදනම් වූ මිනිසාගේ අවශ්‍යතා සහ අයිතිවාසිකම් වලට ගරු කරන ක්‍රමවේදයක් සකස් කිරීමයි.

## 4.5 පුද්ගල අයිතීන් පිළිබඳ අප්‍රිකානු සම්මුති පත්‍රය (1981)

මෙය බැන්ජුල් ප්‍රඥප්තිය (Banjul Charter) යනුවෙන් ද හඳුන්වයි. අප්‍රිකානු මහද්වීපයේ මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට අදාළ ප්‍රධානම ප්‍රකාශයකි.

## 4.6 මානව හිමිකම් පිළිබඳ අරාබි ප්‍රඥප්තිය (2004)

2004 මැයි 22 වන දින, අරාබි රටවල් විසින් මානව හිමිකම් පිළිබඳ අරාබි ප්‍රඥප්තිය සිය රටවලට ඇතුළත් කරගනු ලැබූ අතර මෙහි එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රඥප්තිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම සහ මානව හිමිකම් පිළිබඳ කියතෝ සංකල්පයන්හි ඇතුළත් මූලධර්මයන් ද එහි තහවුරු වී ඇත.

තවද, නිදහස්ව සහ ආරක්ෂිතව සිටීමට ඇති පුද්ගලික අයිතිය, නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවය, වධහිංසා වලින් ආරක්ෂා වීමට ඇති පුද්ගලික අයිතිය, පුද්ගලික දේපළ තබා ගැනීමට ඇති අයිතිය, ආගමික කටයුතු වල නිරත වීමට ඇති අයිතිය සහ නිදහස් සමාගමට සහ රැස්වීමට ඇති පුද්ගලික අයිතිය යනාදී සාම්ප්‍රදායික මානව හිමිකම් මෙහි

මනාව තහවුරු වී ඇත. ප්‍රාන්ත රාජ්‍ය වාර්තා සැලකිල්ලට ගැනීම සඳහා ඡන්ද මගින් සත් දෙනෙකුගෙන් යුත් මානව හිමිකම් පිළිබඳ විශේෂඥ කමිටුවක් පත් කිරීමට මෙම ප්‍රඥප්තිය තුලින් අවශ්‍ය විධිවිධාන සපයා දී ඇත.

## 5.0 සංවර්ධනය සඳහා ඇති අයිතිය

සංවර්ධනය සඳහා වු අයිතියට අදාල ප්‍රඥප්තිය 1986 වසරේදි සම්මත විය. එමගින් සංවර්ධන අයිතිය අන්සතු කල නොහැකි අයිතියක් ලෙස අවධාරණය කෙරේ. එනම්, සියළුදෙනා සතු සහභාගිත්වයේ, සංවර්ධනයට එකතුවීමේ, සහ ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලනමය සංවර්ධනය භුක්තිවිදීමේ අයිතීන් තහවුරු කරයි. 1993 පැවති වියනා ජාත්‍යන්තර සමුළුවේ දී සංවර්ධයනට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශයේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් සාකච්ඡා කෙරුණි. මෙම සමුළුවේ දී සංවර්ධනයට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශය මූලික මානව අයිතිවාසිකම් වල ඒකාබද්ධ වූ කොටසක් බව ප්‍රකාශ කරන ලදී.

මෙම අයිතිය සමන්විත වන්නේ,

- ජාතික සම්පත් සඳහා ඇති ස්ථිර ස්වාධිපත්‍ය
- ස්වයං තීරණ අයිතිය
- ජන සහභාගිත්වය
- සමාන අවස්ථා හිමිවිම යන ඒවායිනි.

## 5.1 සංවර්ධනය සඳහා අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්ම

මානව සංවර්ධන ක්‍රියාදාමයට සම්බන්ධිත කාරය සැලැස්මක් සැකසීම මෙමගින් සිදුවේ. එම කාර්ය සැලැස්ම අන්තරජාතික මානව හිමිකම් සඳහා වන සම්මතයන් මත පිහිටා නිර්මාණය වන අතර, මානව හිමිකම් ප්‍රවර්ධනය ඉලක්ක කරගෙන ක්‍රියාවට නැංවේ.

මෙම අයිතීන් මත පදනම් වු සංවර්ධන දැක්ම මගින් ජාත්‍යන්තර මානව හිමිකම් සඳහා වූ විවිධ ප්‍රතිමාන, සම්මතයන්, සහ ප්‍රතිපත්තීන් සංවර්ධන සැලසුම් සමග සංකලනය කිරීමක් සිදුකරයි.

අයිතීන් පදනම් කර ගත් සංවර්ධනය යන ප්‍රවේශය තුළ අන්තර්ගත මූලිකාංග කිහිපයකි. [13]

- සම්පූර්ණ ඉලක්කය මානව හිමිකම් සම්බන්ධයෙන් විය යුතුය.
- සංවර්ධනයේ ප්‍රධාන ක්‍රියාකරු මහජනතාවය
- වගවීම
- සවිබල ගැන්වීම
- සහභාගිත්වය
- ප්‍රතිඵලය සහ පවත්වාගෙන යෑම අධීක්ෂණය සහ ඇගයීම
- සංවර්ධන ක්‍රියාවලිය ප්‍රදේශයානුබද්ධ අයවලුන් විසින් පාලනය කිරීම
- විශ්ලේශණ සඳහා සියලු පාර්ශවයන් ඇතුලත් කිරීම
- මානව හිමිකම් ප්‍රමිතීන් මාර්ගෝපදේශ ලෙස භාවිතා කිරීම
- වෙනස්කොට නොසැලකිම සහ අවධානමට ලක්වූ කණ්ඩයම් විශේෂ කොට සැලකීම
- තිරසාර සංවර්ධනය

## 6.0 විශ්විය මානව හිමිකම් අභිමුව විවිධ සංස්කෘතීන්හි සාපේක්ෂ වෙනස

සංස්කෘතික සාපේක්ෂතාවාදයට අනුව විශ්විය හිමිකම් වූ කලී එක් එක් සංස්කෘතීන් අතර පවත්නා විෂමතා සැලකිල්ලට නොගන්නා මර්දනකාරී ආයුධයක් වේ. ඇතැම් පෙරදිග රාජ්‍ය මානව හිමිකම් බටහිර අධිරාජ්‍යවාදයේ නව මුහුණුවරක් ලෙස හඳුන්වන අතර එම ප්‍රතිපත්තීන් විශ්විය නොව, එක් එක් සංස්කෘතීන්ට සරිලන ආකාරයෙන් සකස් කල ඒවා විය යුතු යැයි කරුණු ඉදිරිපත් කරති. විශේෂයෙන් ආසියාතික රටවල, ආර්ථික සංවර්ධනය පිළිබඳ අයිතිය වෙනත් මානව හිමිකම් මෙන්ම, ඉන් ඔබ්බට ගොස් මානව ආරක්ෂාව තහවුරු කිරීමේ දී ද මූලික වන්නක් ලෙස සැළකෙයි. ඒනිසාම, මෙවන් රාජ්‍යයන්ට අනුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය අතරතුර මානව හිමිකම් උල්ලංඝනය වීම නොවැළැක්විය හැකි අතුරුඵලයක් බවට පත්වෙයි.

[13] http://www.unfpa.org/human-rights-based-approach

විවිධ සමාජ දෘෂ්ඨීන්ට අනුව යමක් යුක්ති සහගත වේ, එසේත් නැතිනම් නොවේ ද යන්න පිළිබද විවිධ මතයන් පවතී. එහෙයින් මානව හිමිකම් වල අන්තර්ගතය ද එම විෂමතා පිළිබිඹු කල යුතු බව සංස්කෘතික සාපේක්ෂතාවාදයේ දක්වයි. එහෙත් එක් එක් සමාජයන් තුල පවත්නා යුක්ති ධර්මයන් ඇගයීමේ දී ඒවාට ඇති පොදු පිළිගැනීම තීරණාත්මක සම්මුතියක් ලෙස සැලකීම න්‍යාය විරෝධි වනුයේ සෑම සමාජයක්ම ස්වකීය ලාභය සිතැතිව තම සම්මත හා ප්‍රමිතීන් සැකසීමට පෙළඹෙන හෙයිනි.

මානව හිමිකම් වූ කලී, මානව ආරක්ෂාවේ කොටසකි. සංස්කෘතික සාපේක්ෂතාවාදය බොහෝවිට මානව ආරක්ෂාව අවදානමට ලක් කරයි. මානව හිමිකම් නිර්ණය විය යුත්තේ ගතික වුත්, පරිණාමීය වුත් ජාත්‍යන්තර සම්මත පිහිටුවීම් ක්‍රියාවලියක් තුළිනි. මෙහිදී ජාතික හා ප්‍රාදේශීය විශේෂත්වයන්ද ඓතිහාසික, සංස්කෘතික හා ආගමික පසුබිම් ද වැදගත් වේ.

## 7.0 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රමිතීන් හා එහි වර්ධනය

මානව හිමිකම් සංකල්පය ශ්‍රී ලාංකීය සමාජයට නුහුරු නුපුරුදු සංකල්පයක් නොවන බව ඉතිහාසය සාක්ෂි දරනු ලබය. ලාංකික සංස්කෘතිය තුල මානව ගරුත්වය මිනිසාගේ උපතේ සිට මරණය දක්වා ගෞරවයට පාත්‍ර වී ඇත. ක්‍රි.පූ. 161-137 යුගයේ රජ කල දුටු ගැමුණු රජතුමා විසින් එළාර රජතුමා පරාජය කිරීමෙන් අනතුරුව ඔහුගේ සොහොන් කොත අසලින් ගමන් කරන්නෙකු රථයකින් යන්නේ නම් එයින් බැස ගමන් කළ යුතු බවට නියමයක් පැනවීම මගින් සතුරාට වුවද මානව ගරුත්වය ලබා දීමට කටයුතු කර ඇති බව පෙනී යයි. ක්‍රි.පූ 03 වන සියවසේ රජ කල දේවානම් පියතිස්ස රජතුමා මුව දඩයමේ යද්දී මුවකු තණකොළ කමින් සිටියදී ඌ දඩයම් කිරීමට මුවා තණකොළ කා නිම වන තෙක් රැදී සිටීමෙන් පෙනී යන්නේ ද සතුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ඇති බවය. තවද අතීත සමාජයේ ඉතා ප්‍රබල ලෙස වැඩිහිටියන්ට ගරු කිරීමට ද පුරුදු පුහුණු වී සිටි බව නොරහසකි.

මේ ආදී වූ මානව හිමිකම් සංකල්ප ලාංකීය සමාජ තුල ව්‍යාප්ත වූ ආකාරය පිළිබද තවදුරටත් පිරික්සා බැලුම අගනේය.

## 7.1 අතීත ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම

අතීත ශ්‍රී ලංකාවේ තත්ත්වය විමසීමේදී මානව හිමිකම් සුරක්ෂිත කිරීමට එකල රජවරු යම් යම් ක්‍රියා මාර්ග ගෙන ඇත. ක්‍රි.ව. 4 වන සියවසේදී පමණ බුද්ධදාස රජතුමා විසින් අංග විකල පුද්ගලයන් වෙනුවෙන් රෝහලක් ඉදිකර කර ඇත. තවද පුරාතනයේ විසූ ජන කොටස් තම මාළු පංගුවෙන් කොටසක් වැන්දඹුවන්ටද තවත් කොටසක් ආබාධිත පුද්ගලයන්ට ද වෙන් කර ඇත. මෙම ක්‍රියා මගින් කොතෙක් දුරට ආබාධිත සහ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කර ඇති ද යන්න මනාව තහවුරු වේ.

අනුරාධපුර 5 වන කාශ්‍යපප රජුගේ අභයගිරි පුවරු ලිපිය අනුව රාජ්‍ය නිලධාරීන් විසින් වරදකරුවන් සෙවීමේදී වරදෙහි සම්බන්ධ නොවූ ගෙහිමියන්ට හිංසා පීඩා දීම නොකළ යුතු විය. එසේම බදුලු ටැම් ලිපියට අනුව වරදකරුවන් අල්ලා ගැනීම ආදිය කරන නිලධාරීන් ගමේ සෙසු වැසියන්ට කරදර නොකළ යුතුය. මේවා මගින් නීත්‍යානුකූළ අත් අඩංගුවට ගැනීම් පිළිබඳ තහවුරු වන අතර අනෙකාගේ ගරුත්වය සම්බන්ධයෙන් පැවති වගකීම ද පැහැදිලි වේ.

වෝහාරික තිස්ස රජු (ක්‍රි.ව. 214 – 236) සියලුම ශාරීරික දඬුවම් ඉවත් කර හිංසාවෙන් තොර නීති ක්‍රමයක් ඇති කළ බැව් වාර්තා වේ. නිශ්ශංකමල්ල රජු ද පූරව රජ දවස පැවති නොයෙකුත් වධබන්ධන හා පීඩන දණ්ඩන ආදිය ඉවත් කළ බව ශිලා ලේඛන වල කියැවේ. වේවැල්කැටිය ලිපිය මගින් කිසියම් කෙනෙකුට ආයුධ වලින් පහරදී හිංසා කළ හොත් හිංසකයාගෙන් රන් කහවනු 50ක් දඩ වශයෙන් ගත යුතු බවත් ඊට අනුබල දුන් අයෙකුගෙන් කහවනු 50ක් දඩ වශයෙන් අය කළ යුතු බවත් ප්‍රකාශ කර ඇත. IV වන කාශ්‍යපප රජුගේ මොරගොඩ ටැම් ලිපියෙහි සඳහන්ව ඇත්තේ අන් අයට පහර දී අඩන්තේට්ටම් කර විහාර ගම්වලට පැමිණෙන අය ගමට බාර නොගත යුතු බවය. V වන කසුප් රජුගේ මැදිරිගිරි පුවරු ලිපිය මගින් අන් අයට පහර දී විහාර ගම්වලට පැමිණෙන වරදකරුවන් ගමෙන් බැහැර කළ යුතු බව කියවේ. මෙම ශිලා ලේඛන මගින් වධහිංසාවෙන් තොරව ජීවත්වීමේ අයිතිය අතීත ශ්‍රී ලංකාවේ ද තහවුරු කර ඇති බව පෙනේ.

IV වන කසුප් රජුගේ අභයගිරි පුවරු ලිපිය මගින් අභයගිරි නිකායට අයත් ගම් ප්‍රදේශ වල මිනීමැරුම් සිදු කළ අය සිටී නම් රාජ්‍ය නිලධාරීන් එම ගම් වලට ගොස් ඔවුන් ඉල්ලා සිටිය යුතු බව සඳහන් කරනු ලබයි. එපමණක් නොව මිනී මරා සංඝයා වහන්සේලා වසන තැනකට පිවිස වරදකරුවන් හෝ ඊට අනුබල දුන් අය සිටිත් නම් නඩු අසා ඔවුන්ව දඬුදිවට පිටුවහල් කළ යුතු බව ද සදහන් කර ඇත. මෙසේ දඬුදිවට පිටුවහල් කිරීමෙන් පෙනී යන්නේ ඔහුගේ වුවද ජීවත්වීමේ අයිතිය පාලන තන්ත්‍රය පිළිගත් බවය.

අනුරාධපුර V වන කසුප් රජුගේ පුවරු ලිපියේ සඳහන් වන්නේ රජයේ නිලධාරීන් විසින් ගත් දඩ සම්බන්ධයෙන් ගම් වැසියන්ගේ උද්ඝෝෂණයක් හෝ විරෝධයක් තිබේ නම් රජයේ නිලධාරීන් හා දඩ ගැසීමට බලය ඇති නිලධාරීන් හිඳ නඩු විචාල යුතු බවය. තවද බදුලු ටැම් ලිපිය මගින් රජයේ නිලධාරීන් විසින් එහි පනවා ඇති ව්‍යවස්ථා කඩ කොට ගම් වැසියන්ට අයුක්තියක් සිදු කළ හොත් සභාවේ ලේකම් කාර්යාලයේ උසස් නිලධාරීන්ට වාර්තා කොට නිරවුල් කරවා ගැනීමට අවස්ථාව සලසා තිබුණි. මෙමගින් නීතිය ඉදිරියේ සමානාත්මතාවය තහවුරු කර ඇති බව පෙනේ.

ඉහත ආකාරයෙන් අතීත ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් රජවරු යම් යම් ක්‍රියා මාර්ග ගෙන තිබූ බව අනාවරණය වේ.

## 7.2 යටත් විජිත යුගයේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම

ඈත අතීතයේ සිට ලාංකීය රජවරුන් මෙරට පාලනය කළ සමයෙහි වැරදි කළ පුද්ගලයන් සඳහා ශරීරාංග විච්ඡේදනය, උල තැබීම, කසපහර ගැසීම මෙන්ම ඇතුන් ලබා පෑගවීම වැනි අමානුෂික වධහිංසාවන් පැමිණවීම සිදු කරනු ලැබූ නමුත් යටත් විජිත සමයේ එම අමානුෂික වධහිංසාවන් ඉවත් කිරීම මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා සිදු වූ සාධනීය පියවරක් ලෙස හඳුනාගත හැකිය.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයෙහි එතෙක් රාජාණ්ඩු පාලන සමයෙහි සිට පැවත ආ අනිවාර්ය රාජකාරී ක්‍රමය 1844 වහල් සේවය තුරන් කිරීමේ

ආඥා පනත මගින් අහෝසි කරන ලදී. එමගින් ජනතාව බලහත්කාරයෙන් සහ අනිවාර්යෙන් රාජ්‍ය සේවයේ යෙදවීම තහනම් කරන ලදී.

1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගෙන ඒමෙන් අනතුරුව යටත් විජිත පාලන සමය තුල රජයේ අනුග්‍රහය යටතේ පාසැල් පිහිටුවා ප්‍රථම වතාවට පංති භේද, ආර්ථික පසුබිම, ජාති, කුල සහ ආගම් භේද නොසලකා සියලු ජනතාවට සමානව නොමිලේ අධ්‍යාපනය ලබා දීම තුලින් අධ්‍යාපනයට ඇති අයිතිය තහවුරු කරනලදී.

ප්‍රථම වතාවට මානව අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කරමින් 1947 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(2) වගන්තිය යටතේ සුළුතර ජන කොටස් වලට සහ සුළුතර ආගමික කොටස්වලට අයිතිවාසිකම් තහවුරු වන ආකාරයේ නීති සම්පාදනයට යොමු වී ඇත.

## 7.3 නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම

1948 ශ්‍රී ලංකාව යටත් විජිත පාලනයෙන් නිදහස ලබා ඩොමීනියන් රාජ්‍යයක් බවට පත් වුණි. එකී නිදහස ලැබීමෙන් පසු 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මානව හිමිකම් සුරක්ෂිත කිරීමට ව්‍යවස්ථාවේ සඳහන් නීති රෙගුලාසි වලට අමතරව තවත් ක්‍රියාමාර්ග කිහිපියක් ගනු ලැබීය.

1952 සෞඛ්‍ය ආඥාපනත ගෙන ඒමෙන් පසු ජනතාවට නොමිලේ සෞඛ්‍ය සේවාව ලැබීමේ අයිතිය තහවුරු කරන ලදී.

1955.12.14 වන දින එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකාව ද එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී. මෙම ප්‍රඥප්තියට අත්සන් කිරීමෙන් රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට රජය බැඳී සිටී. තවදුරටත් මෙම ප්‍රඥප්තිය පදනම් කරගනිමින් බිහි කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශය පිළිගෙන රටතුල මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමටත් ආරක්ෂා කිරීමටත් කටයුතු සිදු කරන ලදී.

1972 පළමුවන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද මානව හිමිකම් රාශියක් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය යටතේ ඇතුළත් කරන ලදී. කෙසේ නමුත් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකදී ඒ සඳහා ගත හැකි ප්‍රතිකර්ම මෙහි දක්වා නොතිබිණි.

1978 දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ විවිධ මානව හිමිකම් තහවුරු කර ඇත. ඒ අතර මානව හිමිකම් උල්ලංඝනය වීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා යන ක්‍රියාවලියක් සකස් කර ඇත.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 සහ 16 සංශෝධන මගින් භාෂා අයිතිය තහුරු කර ඇත. තවද 1991 අංක 18 දරණ පනත මගින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු පිහිටුවා භාෂා අයිතිය තවදුරටත් තහවුරු කිරීමට කටයුතු සිදු කරන ලදී.

1980 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කරනු ලැබීය.

1981 වර්ෂයේ දී කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස්කොට දැක්වීම වැලැක්වීමේ ජාත්‍යන්තර සම්මුතිය, 1982 වර්ෂයේ දී සියළුම ආකාරයේ වාර්ගික අසමානතා පිටු දැකීමේ ජාත්‍යන්තර සම්මුතිය, 1991 වර්ෂයේ දී ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1994 වර්ෂයේ දී කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ සම්මුතිය, 1996 වර්ෂයේ දී විදේශික කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් සඳහා වන අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය යන සම්මුතීන් අපරානුමත කරන ලදී.

ශ්‍රී ලංකාව තුල පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමට ගෙන ඇති විවිධ පියවරයන් අතරට 1980 අංක 47 දරණ පනත මගින් මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීම ද සඳහන් කළ හැකිය.

සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීමට සහ විදේශ සේවා නියෝජිතයින් නියමානුකූල බවට පත්කිරීම සඳහා 1982 අංක 32 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලදී.

1993 මාර්තු 03 වන දින අනුමත කර ගන්නා ලද කාන්තා ප්‍රඥප්තිය තුලින් කාන්තාව පුරුෂයන් හා සමානව මානව හිමිකම් සහ මූලික නිදහස භුක්ති විඳීම සහතික කර ඇත.

1998 අංක 50 දරණ ළමාරක්ෂක අධිකාරිය ළමා අපයොජන වැලැක්වීම සහ ළමා අපයෝජන වින්දිතයන් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලදී.

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ 2003 අංක 33 දරණ සංශෝධන පනත මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් තහුවරු කර ඇත.

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති සම්මුති වලට අදාළව පිහිටුවා ඇති ජාත්‍යන්තර කමිටු වෙත රජයේ බැඳීම පවතී. ඒ අනුව රටතුල විවිධ පනත් පාර්ලිමේන්තුව මගින් සම්මත කර ඇත. මෙහිදී 1994 දී වධහිංසාවට හා ඊට කෲර අමානුෂික අවමන් සහගත සැලකීම් වලට එරෙහි සම්මුති පනත සහ 2007 දී සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත වැදගත් ස්ථානයක් ගනී. එමෙන්ම රටතුල ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව දේශීය යාන්ත්‍රණයක් ඇති කරන ලදී. 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත සම්මත කරමින් රටතුල මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට කටයුතු යොදන ලදී.

2000 අංක 09 දරණ වැඩිහිටි පනත මගින් වැඩිහිටි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම අපේක්ෂා කර ඇත.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සඳහා 2005 අංක 34 දරණ පනත පිහිටුවීම මගින් විශේෂයෙන් කාන්තා අයිතිවාසිකම් තහවුරු කර ඇත.

විවිධ ආයතන තුළ ජාත්‍යන්තර ප්‍රමිතීන් ඇතුලත් කරමින් පරිපාලන ව්‍යුහයන් ඇති කරන ලදී. විශේෂයෙන් පොලිස් ස්ථානවල ළමා හා කාන්තා ඒකකයක් සහ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරීන්, කාන්තා සංවර්ධන නිලධාරීන්, වැඩිහිටි ආරක්ෂක නිලධාරීන් පත්කරමින් ඒ මගින් ඔවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට වැඩපිළිවෙලවල් යොදන ලදී.

එමෙන්ම පවත්නා නීති ශක්තිමත් කිරීමට ද කටයුතු සිදුකරනු ලැබ ඇත. කුට්ටනය යන වරද දණ්ඩ නීති සංග්‍රහයට ඇතුලත් කරන ලදී. කාන්තා සහ ළමයින් සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුලත් නීති ශක්තිමත් කරමින් නව වැරදි හඳුන්වා දීම හා තිබූ නීති තවදුරටත් ප්‍රබල කරනු ලැබීය.

2011 වර්ෂයේ දී ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මක් 2011 - 2016 තෙක් රජය විසින් සකස් කරන ලදී. ඒ අනුව ඉදිරි වැඩකටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකාව තුල විවිධ අවස්ථාවල මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් විශේෂ කොමිෂන් සභා පත්කරමින් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරමින් වාර්තා ලබා ගන්නා ලදී. උදාහරණ වශයෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව, අතුරුදහන්වූවන් පිළිබඳ කොමිෂන් සභාව ආදිය දැක්විය හැකිය.

2015 වර්ෂයේ දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් තොරතුරු දැනගැනීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙසට පිළිගන්නා ලදී. 2015 වර්ෂයේ දී වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදී.

මේ ආකාරයෙන් විවිධ වූ මානව හිමිකම් වලට අදාළව නොයෙකුත් අණ පනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, ප්‍රතිපත්ති, රෙගුලාසි සහ චක්‍රලේඛ බිහි වෙමින් තවදුරටත් ඒවා වර්ධනය වෙමින් රටතුල ජනතාවට යහපත් වූ මානව හිමිකම් සංස්කෘතියක් බිහි කිරීමෙහි ක්‍රියාදාමය නොනැවතී ඉදිරියට ගමන් කරමින් පවතී.

## 8.0 මානව හිමිකම් පිළිබඳ නවමු මතවාදයන්

විශ්වීය අවශ්‍යතා අනුව සහ වෙනස් වන සමාජ ව්‍යුහයන් අනුව මානව හිමිකම් දර්ශනයන් ද වෙනස් වේ. මානව හිමිකම් සහ ගෝලීයකරණය, මානව හිමිකම් සහ කාලගුණික වෙනස්වීම්, මානව හිමිකම් සහ තාක්ෂණය, ව්‍යාපාරකරණය සහ මානව හිමිකම්, දූෂණය සහ මානව හිමිකම් හා දරිද්‍රතාවය සහ ලිංගිකත්වයමත වෙනස්කම් වලට ලක්වන අයගේ අයිතිවාසිකම් (LGBTI) යන ක්ෂේත්‍ර නිදසුන් ලෙස දැක්විය හැකිය.

## 8.1 මානව හිමිකම් සහ ගෝලීයකරණය (Human Rights & Globalization)

වර්තමානයේ සියළුම රටවල් ගෝලීයකරණ ක්‍රියාවලිය මගින් එක් වහලක් යටට පැමිණ තිබේ. මෙය පදනම් කර ගෙන මානව හිමිකම් හා ගෝලීයකරණය යන සංකල්පය බිහි වි ඇත. මෙමගින් මානව හිමිකම් ප්‍රමිතීන් ලෝකයේ විවිධ කලාප වලට විහිදුවාලීමට උත්සාහ කරනු ලැබේ. තවද මේ හරහා ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය මට්ටමින් මෙම ප්‍රමිතීන් කෙතරම් දුරට අර්ථ දැක්විය යුතුද සහ ක්‍රියාත්මක වනවාද යන්න අධීක්ෂණය කරනු ලැබේ.

## 8.2 මානව හිමිකම් හා ව්‍යාපාරකරණය (Human Rights & Business)

මානව හිමිකම් සම්බන්ධයෙන් අවධානයට ලක් වි ඇති නව විෂය කරුණක් වනුයේ මානව හිමිකම් සහ ව්‍යාපාරකරණයයි. ගෝලීයකරණ ක්‍රියාකාරකම් මගින් ලෝකය පුළුල් වෙමින් පවතින නිසා පොදු සහ පුද්ගලික, දේශීය සහ බහු ජාතික සමාගම්වල ක්‍රියාකාරකම්ද පුළුල් වෙමින් පවතී. මෙමගින් රටවල් වලට ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් ඇතිවීමට ඉඩ ප්‍රස්ථා ඇත. මෙවැනි ව්‍යාපාර මගින් මානව හිමිකම් විෂය කෙරෙහි ද සෘජු සහ වක්‍ර බලපෑම් ඇති විමට ඉඩ ඇත. එම නිසා මානව හිමිකම් සහ ව්‍යාපාරකරණය යන සංකල්පය ශක්තිමත් වි තිරසාර සංවර්ධනයේ දී සහ ලෝක ආර්ථික කටයුතු වල දී මානව හිමිකම් වලට ගරු කල යුතු යැයි අවධාරණය කරනු ලැබේ.

## 8.3 මානව හිමිකම් සහ තාක්ෂණය (Human Rights & Technology)

වර්තමාන ලෝකයේ තොරතුරු තාක්ෂණයේ අති දැවැන්ත වර්ධනයක් සිදු වී ඇත. ජංගම දුරකථන, ඩිජිටල් තාක්ෂණය (Digital) වෙබ් අඩවි සහ ජාල තාක්ෂණය මානව හිමිකම් ක්‍රියාකාරම් වලට පරිවර්තන වේ. එම නිසා මානව හිමිකම් සහ තාක්ෂණය යන සංකල්පය ඉතා වැදගත් වේ. මෙය මානුෂවාදී ක්‍රියාකාරකම් වලට, ආපදාවන්ට, හදිසි අවස්ථාවන්ට, භයානක අවස්ථාවන්ට සහ ලෝක සෞඛ්‍ය කටයුතු වලට, ජාත්‍යන්තර සබඳතා වලට සහ ප්‍රතිපත්තිවලට මැදිහත්වීමත් උපයෝග කරගනිමින් මානව හිමිකම් තහවුරු කරනු ලැබේ.

## 8.4 ඩිජිටල් යුගය සහ පුද්ගලික නිදහස (Digital Age & Right to Privacy)

වර්තමාන තාක්ෂණික වර්ධනයේ කථාබහට ලක්වන අනෙක් විෂය කරුණ වනුයේ ඩිජිටල් යුගය සහ පුද්ගලික නිදහසයි. මෙම යුගයේ දී බහුලවම සමාජ මාධ්‍ය මගින් තොරතුරු හුවමාරුව සිදු වන නිසා පුද්ගල නිදහසට බලපෑම් සිදු විය හැකිය. එම නිසා මේ සම්බන්ධයෙන් සුදුසු යාන්ත්‍රණයක් සකස් වීමේ අවශ්‍යතාවයක් ඇති බව අවධාරණය කරනු ලැබේ.

## 8.5 මානව හිමිකම් සහ කාලගුණික වෙනස්වීම් (Human Rights & Climate Change)

මිනිසුන් විසින් සිදු කරනු ලබන ස්වභාවික සම්පත් අනිසි භාවිතය නිසා එය විශාල වශයෙන් පරිසරියට හානිදායක වන බව පෙනී යයි. විශේෂයෙන් කාලගුණික වෙනස්වීම් නිසා මිනිසුන්ට විශාල විපත් ගෙන දී ඇත. එම නිසා මිනිසුන්ට මානව හිමිකම් සම්පූර්ණ ලෙස භුක්ති විඳිය නොහැකි තත්ත්වයට පත් වී ඇත. මෙය මනුෂ්‍ය ප්‍රජාවගේ ජීවත්වීමේ අයිතියට සෘජුව සහ වක්‍රව තර්ජනයක් වී ඇත. තවද සාගින්න, මන්ද පෝෂණය ළමයින්ගේ වැඩීමට ද බාධා පමුණවයි. එම නිසා වර්තමානයේ මානව හිමිකම් සහ කාලගුණික වෙනස් වීම් යන මාතෘකාවට විශේෂ අවධානයක් යොමු වී ඇත.

## 8.6 මානව හිමිකම් සහ දරිද්‍රතාවය ( Human Rights & Poverty )

තුන්වෙනි ලෝකයේ වාසය කරන බහුතරයක් ජනතාව දුරිද්‍රතාවයෙන් පෙළේ. මෙම තත්වය නිසා ආර්ථික සමාජ අයිතිවාසිකම් වලට අයත් සෞඛ්‍ය අයිතිවාසිකම්, නිවාස පහසුකම්, ආහාර, පිරිසිදු ජලය, අධ්‍යාපනය යන අයිතිවාසිකම් බරපතල ලෙස බලපෑමකට ලක්වේ.

තවද නීතියේ සාධාරණත්වය, දේශපාලන සහභාගිත්වය සහ මානව ආරක්ෂාව යන සිවිල් දේශපාලන අයිතිවාසිකම් ද බලපෑමකට ලක්වේ.

මේ හේතුවෙන් මානව හිමිකම් හා දුරිද්‍රතාවය යන විෂය පිළිබඳ විශේෂ අවධානයකට ලක්ව ඇත. මේ තුලින් දරිද්‍රතාවය තුරන් කර මානවයාගේ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීමට දායකත්වයක් ලබා දේ.

## 8.7 මානව හිමිකම් හා දූෂණය ( Human Rights & Corruption )

වර්තමාන කාලයේදි විවිධ දූෂණ ක්‍රියාකාරකම් සීඝ්‍රයෙන් වර්ධනය වීමක් දක්නට ඇත. මෙම තත්වය සාමාන්‍යයෙන් ආර්ථික හා දේශපාලන පදනම මුල්කරගෙන සලකා බලනු ලැබේ. නමුත් මේ නිසා අයිතිවාසිකම් දැඩි ලෙස හානියකට පත් වේ.

ඒ බැවින් මානව හිමිකම් හා දූෂණය යන විෂය කෙරෙහි වර්තමානයේ විශේෂ අවධානයකින් යුතුව සලකා බැලේ. මෙහිදි මානව හිමිකම් හා දූෂණය යන සංකල්පය අධ්‍යනය කලයුතු වන්නේ මිනිසා මූලික කරගෙනය.

## 8.8 ලිංගිකත්වය මත වෙනස්වීමකට ලක්වන ජන කණ්ඩායම් (LGBTI)

වර්තමාන ලෝකයේ සමාජ සංයුතිය විවිධ ලෙසින් වෙනස් වීම් වලට භාජනය වේ. මේ නිසා සමාජයේ මිනිසුන් අතර විවිධ සම්බන්ධතා ගොඩනැගෙන්නා සේම නව ප්‍රවණතාද බිහිවේ. වර්තමානයේ මේ තත්ත්වය තුලින් මෙම සමාජ කණ්ඩායම් තම අයිතිවාසිකම් වෙනුවෙන් හඬක් නැංවීමට ඉදිරිපත් වි ඇත.

ස්ත්‍රී සමලිංගික (LESBIAN) සමලිංගික පුරුෂ (GAY) ද්විලිංගිකයන් පුද්ගලයින් (BISEXUAL) සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් (TRANCE GENDER) වැනි සමාජ කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වය යම් සමාජයක් පිළිගන්නා අතර තවත් සමාජයක් මෙම තත්වය දැඩි ලෙසින් ප්‍රතික්ෂේප කිරීමකට ලක් කර ඇත.

මේ හේතුන් මත මෙවැනි පුද්ගලයන් සමාජය මගින් විවිධාකාරවූ හිංසාවන්ට භාජනය කරනු ලැබේ. විශේෂයෙන්ම අසාධාරණ නීතීන් මත රඳවා තබාගැනීම් හා සමානාත්මතාවයෙන් තොරව සැලකීම, වාරණය, රැකිරක්ෂා කටයුතු වලදී, නිවාස පහසුකම් ලබා ගැනීමේදී, වෙනස් කොට සැලකීමට ලක්වේ. තවද මෙම පිරිස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වීමද සිදුවේ.

එබැවින් මෙම පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීමට වර්තමාන ලෝකයේ විශේෂ අවධානයක් යොමුව ඇත.

## 8.9 ප්‍රජනන අයිතිවාසිකම් (Reproductive Rights)

වර්තමානයේ කතාබහට ලක්වන සමාජීය කරුණක් වශයෙන් මෙම ප්‍රජනන අයිතිවාසිකම් හඳුන්වා දිය හැකිය.

ප්‍රජනන අයිතිවාසිකම් යනු නීතීමය වශයෙන් හිමිවන අයිතිවාසිකමකි, අයිතිවාසිකම් පදනම සෑම ස්වාමිපුරුෂයකුට හා භාර්යාවකටම ළමුන් සංඛ්‍යාව, වයස් පරතරය සහ කාලය, නිදහස, වගකීම් තීරණ ගැනීමේ අයිතිය මෙන්ම මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට අයිතියක් හිමිවේ.

මේ අයුරින් මානව හිමිකම් හා සබැඳි නවීන මාතෘකාවන් විවිධාකාර කෝණ වලින් ගැඹුරින් විමසා බැලීම මානව හිමිකම් වර්ධනයට මනා පිටුවහලක් සේම රටෙහි සංවර්ධනයටත් දායකත්වයක් සපයයි.

## 9.0 රාජ්‍ය වගකීම

සමාජය තුල ප්‍රධාන වගකීම් දරන්නා වන්නේ රජයයි. රජය මානව හිමිකම් ගරු කිරීම, සුරැකීම හා තහවුරු කිරීමට බැඳී සිටින්නේය. මෙම වගකීම රජයේ පරමාරථ හා කාරයභාරය තුලින් බිහිවේ. සැබවින්ම රජයත් එහි සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ වගකීම දැරිය යුත්තේය. රජය යනු නීතිය හා සාමය ද රජයේ වෙනත් කාර්යන්ද පවත්වාගෙන යන සම්පූර්ණ සාමාජිකයායි. මෙම නීතිය හා සාමය මානව හිමිකම් හි මූලික ප්‍රතිපත්ති මත පදනම් විය යුතුය. ඒ අනුව රජයක් විසින් මානව හිමිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය නීති රීති සකස් කළ යුතුය. මෙහිදී තනි පුද්ගලයා සමාජීය හා ජාත්‍යන්තරයද මෙකී කාර්ය ඉටු කිරීමට රජයට අවශ්‍ය සහය දැක්විය යුතුය. රජයකට මානව හිමිකම් පිළිබඳව පහත වගකීම් මෙන්ම යුතුකම් ද ජාත්‍යන්තර නිතිය මගින් පවරා ඇත.

## 9.1 මානව හිමිකම් වලට ගෞරව කළ යුතුය.

තනි පුද්ගලයන්ට මානව හිමිකම් භුක්ති විඳිම අහිමි කරවන ඕනෑම පියවරක් වැළැක්විම මෙමගින් අදහස් වේ. එනම් රාජ්‍යයන් විසින් තනි පුද්ගලයෙකු සතු අයිතිවාසිකම් සඳහා ගෞරව කිරීමේ වගකීම ද දරනු ලබයි. **මූලිකවම ගරු කිරීම පිළිබඳව සලකා බැලීමේ දී රාජ්‍ය විසින් සියළුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට බලපෑම් කිරීමෙන් වැළැක්විය යුතු වේ.** මෙහිදී රාජ්‍ය විසින් අයිතිවාසිකම් හිමවන්නන් ඔවුනගේ නිදහස පුද්ගල නිදහස, ස්වාධීනත්වයට ගරු කිරීම සිදු කළ යුතුය. තවද සමාජ ආර්ථික අයිතිවාසිකම් වලට ද ගරු කළ යුතුය. එමගින් අදහස් වන්නේ රාජ්‍යයන් විසින් සම්පත් නිදහසේ භාවිතා කිරීමට අවස්ථාව ලබා දෙනු ලබන බවයි.

## 9.2 මානව හිමිකම් ආරක්ෂා කිරීම

තුන්වන පාර්ශවයක් විසින් සිදු කරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් රාජ්‍යයන් විසින් වැළැක්විය යුතුය. එනම් මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ වගකීම රාජ්‍ය විසින් දරනු ලැබිය යුත්තේය. මානව අයිතිවාසිකම් හිමි

වන්නන්ට සිදු වන උල්ලංඝණයන්හිදී අවශ්‍ය සහනයන් ලබාදෙමින් නීතිමය රැකවරණය, ආරක්‍ෂාව ඔවුනට ලබා දිය යුතුය. මෙහිදී තනි පුද්ගලයන්ට තම අයිතිවාසිකම් හා නිදහස පිළිබඳව දැනුම ලබා දෙමින් මානව හිමිකම් ප්‍රවර්ධනයට රාජ්‍යයන් කටයුතු සිදු කළ යුතු අතර එය මානව හිමිකම් සුරක්‍ෂිත වීමට මග පෑදීමක් වනු ඇත.

## 9.3 මානව හිමිකම් සපුරාලිය යුතුය

ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් මගින් තහවුරු කරනු ලැබූ මූලික මානව හිමිකම් රටේ පුරවැසියන්ට සතුටුදායක ලෙස භුක්ති විඳීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීමට රාජ්‍යයන් සහතික විය යුතුය. එනම් තම රට වැසියන්ට මානව හිමිකම් හිමි වන ආකාරයේ වටපිටාවක් රට තුළ සකස් කළ යුතුය. වියානා ප්‍රකාශයේ සඳහන් කරනු ලබන්නේ මානව හිමිකම් දුක්ගැනවිලි හෝ උල්ලංඝනයන් පිළිබඳව සහන ලබා ගැනීම සඳහා සියළුම රාජ්‍යයන් විසින් ඵලදායි නීතිමය රාමුවක් ස්ථාපිත කළ යුතු බවයි.

## 10.0 නිගමනය

දීර්ඝකාලයක් පුරා සිදු කල අරගල වල ප්‍රතිඵලයන් ලෙස මානව හිමිකම් පිළිබඳ සංකල්පයන් වර්ධනය වී අද පවතින තත්ත්වයට පත්වී ඇත. නමුත් මෙකී තත්වයද මානව හිමිකම් සංකල්පය සමග තවත් නවමු අදහස් ද එකතුවීමෙන් අනාගතයේ ද වර්ධනය වනු ඇත.

## ආශ්‍රිත ප්‍රකාශන:

- ධම්ම පදය
- මානව හිමිකම් - එක්සත් ජාතීන්ගේ සංවිධාන නිලධාරීන් සඳහා සරල අත්පොතක් : මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය
- මානව හිමිකම් සහ ජාත්‍යන්තර නීතිය යටතේ ඒවායේ ආරක්‍ෂාව :
- පොලිස් නිලධාරීන් සඳහා කෙටි පබැඳුමක්, සකස් කිරීම රල්ෆ් කෲෂෝ වියෙනා ප්‍රකාශනය සහ ක්‍රියා සැලැස්ම,
- මානව හිමිකම් පිළිබඳ ලෝක සමුළුව, 1993 ජුනි මස 25 වනදා වියෙනා හිදී
- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය
- මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශය
- සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය
- ආර්ථික, සංස්කෘතික හා සමාජ අයිතීන් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය
- සියළුම ආකාරයේ වාර්ගික අසමානතා පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය
- කාන්තාවන්ට සිදුවන සියළුම ආකාරයේ වෙනස්කොට දැක්වීම් වැලැක්වීමේ සම්මුතිය
- කෲර හා අමානුෂික සැලකීමට හා වධහිංසාවන්ට භාජනය වීමෙන් වැලකී සිටීමේ සම්මුතිය
- ළමා අයිතිවාසිකම් සම්මුතිය
- විදේශික කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් සඳහා වන අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ජාත්‍යන්තර සම්මුතිය
- ආබාධිත පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ සම්මුතිය
- සංවර්ධනයට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශය
- රෝම ව්‍යවස්ථාව
- තොරතුරු පත්‍රිකා අංක30-එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ගිවිසුම් පද්ධතිය: ප්‍රධාන මානව හිමිකම් ගිවිසුම් සහ ගිවිසුම් සංවිධාන පිළිබඳ හැඳින්වීමක්
- ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන වලින් හෙළිවන මානව අයිතිවාසිකම් ධම්මිකා ප්‍රියදර්ශනී ගමගේ
- 1978 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1978 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 19 වන සංශෝධනය
- 1939 - අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත
- 1952 - අංක 12 දරණ සෞඛ්‍ය ආඥා පනත
- 1991 - අංක 18 දරණ රාජ්‍ය භාෂා පනත
- 1980 - අංක 47 දරණ මධ්‍යම පරිසර අධිකාරී පනත
- 1998 - අංක 50 දරණ ළමාරක්‍ෂක අධිකාරී පනත

- 1996 - අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත
- 2003 - අංක 33 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධිත) පනත
- 1994 - අංක 22 දරණ වධහිංසාවන්ට කෲර අමානුෂික හා අවමන් සහගත සැළකීම් වලට එරෙහි සම්මුති පනත
- 2007 - අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත
- 1996 - අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත
- 2000 - අංක 09 දරණ වැඩිපනත
- 2005 - අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත
- 2015 - අංක 4 දරණ වින්දිතයන් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්ති පනත

වෙබ් අඩවි

- www.ohchr.org
- www.unfpa.org
- www.icrc.org
- www.europa.ew
- www.un.org
- www.who.int

# මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

## පූර්විකාව

ලෝකයේ පවත්නා නිදහස, යුක්තිය සහ සාමය යන්නෙහි පදනම මිනිස් පවුලේ සියලු දෙනාගේම සහජ ගරුත්වය හා අන්සතු කළනොහැකි වූ සම අයිතිවාසිකම් පිළිගැනීම වන හෙයින්ද, මානව අයිතිවාසිකම් නොතැකීම හා අවඥාවට ලක්කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂිය සාහසික පීඩනයට භාජනය කෙරෙන ම්ලේච්ඡ කෲරකම් සිදුවී ඇති හෙයින් ද මිනිස් වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහසත්, බියෙන් හා අගහිගකමින් තොරවීමේ නිදහසත් භුක්ති විඳීමට හැකි ප්‍රජාවක් ඇරඹීම පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨතම අපේක්ෂාව ලෙස ප්‍රකාශයට පත් වී ඇති හෙයින්ද,

දුෂ්ඨ පාලනයන්ට හා පරිපීඩනයන්ට විරුද්ධව අන්තිම ක්‍රියා මාර්ගයක් වශයෙන් කැරලි කෝලාහල ඇති කිරීමට මිනිසා පෙළඹවීමට නම් නීති මගින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කරදීම  අත්‍යාවශ්‍ය වන හෙයින්ද,

ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා තවදුරටත් වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වන හෙයින්ද,

මූලික මානව අයිතිවාසිකම් කෙරෙහිත්, මිනිසාගේ ගරුත්වය හා අගය කෙරෙහිත්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සමාන අයිතිවාසිකම් කෙරෙහිත්, තම විශ්වාසය හා භක්තිය එක්සත් ජාතීන්ගේ සාමාජික ජාතීන් විසින් ප්‍රඥප්තියෙහි ස්ථිර ලෙස නැවත පිළිගෙන ඇති හෙයින්ද, සමාජ ප්‍රගතිය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් වඩා පුළුල් ලෙස වර්ධනය කිරීමට අධිෂ්ඨානය කර ඇති හෙයින්ද,

මානව අයිතිවාසිකම් හා මූලික ස්වාධීනත්වයන් කෙරෙහි විශ්ව ගරුත්වයන්, ඒවා රැකදීමත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහයෝගිත්වයෙන් වර්ධනය කිරීමට සාමාජික රාජ්‍ය ප්‍රතිඥා දී ඇති හෙයින්ද,

ඒ ප්‍රතිඥාව පරිපූර්ණව සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අයිතිවාසිකම් හා ස්වාධීනතා පිළිබඳව පොදු අවබෝධය ලබා ගැනීම අතිශයින් වැදගත් වන හෙයින්ද,
එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මෙසේ ප්‍රකාශ කර සිටී.

මානව අයිතිවාසිකම් පිළිබඳ මෙම විශ්ව ප්‍රකාශනය සමාජය සෑම පුද්ගලයෙකු හා සංවිධානයක් විසින් නිරන්තරයෙන්ම සිහිපත් කෙරෙමින් සකල ජනතාවන්ට හා සියලු ජාතීන්ට

සාක්ෂාත් කරගත යුතු පොදු තත්ත්වයක් වශයෙන් අධ්‍යාපනයෙන් හා අධ්‍යයනයෙන් මෙම අයිතිවාසිකම් හා ස්වාධීනත්වයන් ගරු කළ යුතුයයිද, ජාතික වුත්, ජාත්‍යන්තර වුත්, ප්‍රගතිශීලි විධිවිධාන මගින් මේ හිමිකම් සාමාජික රටවල මෙන්ම ඒවායේ බලයට අවනත සෙසු රටවල ජනතාව අතරද අගය කිරීමට සැලැස්වීමෙන් ලෝකය මුළුල්ලේම ඒ පිළිබඳ ගරුත්වය හා ක්‍රියාකාරිත්වය සැලසිය යුතුයයිද ප්‍රකාශ කර සිටී.

## 1 වන වගන්තිය:

සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇත. ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති. යුක්ති අයුක්ති පිළිබඳ හැඟීමෙන් හා හෘදය සාක්ෂියෙන් යුත් ඔවුන්, ඔවුනොවුන්ට සැළකිය යුත්තේ සහෝදරත්වය පිළිබඳ හැඟීමෙනි.

## 2 වන වගන්තිය:

ජාති, වංශ, වර්ණ, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම්, දේශපාලන ආදි කවර භේදයක් හෝ සමාජ, ජාතික, දේපළ, උපත ආදී කවර තත්ත්වයක විශේෂයක් හෝ නොමැතිව මේ ප්‍රකාශයේ සඳහන් සියලු හිමිකම් වලට හා ස්වාධීනත්වයන්ට සෑම පුද්ගලයකුම උරුම වන්නේය.

තවද යම් පුද්ගලයකු අයත්වන රටේ දේශපාලන, නීතිමය හෝ ජාත්‍යන්තර තත්ත්වයන් පිළිබඳ කිසිදු විශේෂයක් ද ඒ රට ස්වාධීන, භාරකාර, පරාධීන ආදී කවර තත්ත්වයක් පිළිබඳ විශේෂයක් ද නොමැතිව මේ හිමිකම් ඔහු සතු වන්නේය.

## 3 වන වගන්තිය

සෑම පුද්ගලයකුටම ජීවත්වීමටත්, නිදහස්ව සිටීමටත්, පෞද්ගලික ආරක්ෂාවටත් හිමිකම් ඇත්තේය.

## 4 වන වගන්තිය

කිසිම පුද්ගලයෙකු වහල්කමෙහි හෝ බන්ධනයෙහි (දාස භාවයෙහි) නොරැඳවිය යුතුය. සෑම ආකාරයකම වහල් වෙළඳාම හා වහල්කම තහනම් වන්නේය.

## 5 වන වගන්තිය

කිසිම පුද්ගලයකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික පහත් සැළකිල්ලකට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතුය.

## 6 වන වගන්තිය

සෑම අවස්ථාවකදීම නීතිය ඉදිරියේ පුද්ගලයකු වශයෙන් පිළිගනු ලැබීමේ අයිතිය සෑම කෙනෙකුම සතුය.

## 7 වන වගන්තිය

සියල්ලන්ම නීතිය ඉදිරියේ එකිනෙකාට සමාන වන අතර, නීතියේ ආරක්ෂාව ලැබීමට කිසිදු විශේෂයක් නොමැතිව, සියල්ලෝම හිමිකම් ලබති. මේ ප්‍රකාශනයට පටහැනි ලෙස කෙරෙන ඕනෑම අසාධාරණයකින් ආරක්ෂාවීමේ අයිතියත් එබඳු අසාධාරණයන්ට පෙළඹවීමෙන් ආරක්ෂාවීමේ අයිතියත් සියල්ලන්ටම හිමිවේ.

## 8 වැනි වගන්තිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලින් හෝ නීතියෙන් හෝ ප්‍රදානය වී ඇති මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකදී බලධාරී ජාතික අධිකරණයකින් ප්‍රතිකර්ම යොදා ගැනීමේ හිමිකම් සෑම පුද්ගලයෙකුම සතුවේ.

## 9 වැනි වගන්තිය

බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීම හෝ අත්අඩංගුවේ රඳවා තැබීමට හෝ පිටුවහල් කිරීමට හෝ කිසිම පුද්ගලයෙකු භාජනය නොකළයුතුය.

## 10 වැනි වගන්තිය

තමන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව හෝ තමන්ට විරුද්ධව යම් අපරාධ චෝදනාවක් පිළිබඳව හෝ නිශ්චය කිරීම සඳහා සාධාරණය වූත්, විවෘත වූත් ස්වාධීන අපක්ෂපාත නඩු විභාගයකට සෑම තැනැත්තෙකුම පූර්ණ සමානත්වයෙන් යුතුව හිමිකම් ලබයි.

## 11 වැනි වගන්තිය

(1) දණ්ඩන වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි සෑම පුද්ගලයෙකුටම, නීත්‍යානුකූල විවෘත අධිකරණ විභාගයකින් වරදකරු බව ඔප්පු වන තෙක් නිර්දෝෂියකු ලෙස සළකනු ලැබීමටත්, ඒ අධිකරණයේදී තම නිදහසට කරුණු පෙන්වා සිටීමට උවමනා සියලු අවශ්‍යතා නොඅඩුව ලැබීමටත් හිමිකම් ඇත්තේය.

(2) යම් වරදක් හෝ ප්‍රමාද දෝෂයක් කිසිවෙකුගෙන් සිදු වූ අවස්ථාවේදී එම කාලයේ පවතින ජාතික හෝ අන්තර් ජාතික නීතියේදී එම වරද හෝ ප්‍රමාද දෝෂය දණ්ඩන වරදක් සේ නොසඳහන්ව පැවති නම් එම වරදට හෝ ප්‍රමාද දෝෂයට ඔහු වරදකරුවෙකු ලෙස නොසැළකිය යුතුය. දණ්ඩන වරද කළ කාලයේදී වලංගුව පැවති දඬුවමකට වඩා වැඩි දඬුවමක් එවැනි වරදකරුවකු උදෙසා නොපැනවිය යුතුය.

## 12 වන වගන්තිය

කිසිම පුද්ගලයෙකුගේ පෞද්ගලික ජීවිතයට (රහස් භාවයට) පවුලට, නිවසට හෝ ලිපි ගනුදෙනුවලට බලෙන් ඇඟිලි ගැසීම හෝ ගරුත්වයට හෝ වැදගත් භාවයට පහර ගැසීම හෝ නොකළ යුතුය. එබඳු ඇඟිලි ගැසීම් හෝ පහර ගැසීම් වලට විරුද්ධව නීතියේ රැකවරණ ලැබීමේ අයිතිය සෑම පුද්ගලයෙකුම සතුව ඇත.

## 13 වන වගන්තිය

(1) සෑම පුද්ගලයෙකුම තම රාජ්‍ය සීමාව ඇතුලත නිදහසේ ගමනා ගමනයට හා පදිංචියට හිමිකම් තිබේ.

(2) ස්වකීය රට ද ඇතුළුව කවර දේශයකින් හෝ ඉවත්ව යාමටත්, තම රටට ආපසු පැමිණීමටත් සෑම පුද්ගලයකුටම හිමිකම් ඇත.

## 14 වන වගන්තිය

(1) පරිපීඩනයන්ගෙන් මිදී විදේශයක අභයාරක්ෂාව සෙවීමට හා එය භුක්ති විඳීමට සෑම පුද්ගලයකුටම හිමිකම් ඇත.

(2) දේශපාලනමය නොවූ අපරාධවලින් උද්ගතවන චෝදනා හා එක්සත් ජාතීන්ගේ අරමුණුවලට පටහැනි ක්‍රියාවන් නිසා පැන නගින චෝදනාවලට ලක් වූවන් සම්බන්ධයෙන් යට කී හිමිකම් ක්‍රියාත්මක නොවනු ඇත.

## 15 වන වගන්තිය

(1) සෑම පුද්ගලයකුටම ජාතිකත්වයකට හිමිකම් ඇත.

(2) කිසිම පුද්ගලයකු සතු ජාතිකත්වය බලෙන් අහෝසි නොකළ යුතු අතර, ඔහුගේ ජාතිකත්වය වෙනස් කිරීමට ඔහුට ඇති අයිතිය පැහැර නොගත යුතුය.

## 16 වන වගන්තිය

(1) පූර්ණ වියට පත් සියලු ස්ත්‍රී පුරුෂයන්ට ජාතිය, ජාතිකත්වය හෝ ආගම ආදී කිසිදු සීමාවන් නොපතා විවාහ වී පවුලක් ඇති කිරීමේ අයිතිය ඇත්තේය. විවාහ වීමේදී මෙන්ම විවාහය අවලංගු කිරීමේදී ද ඔවුන් සමාන අයිතිවාසිකම් දරයි.

(2) විවාහයකට ඇතුළත් කළ යුත්තේ එසේ ඇතුළත් වන ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ සම්පූර්ණ නිදහස් කැමැත්ත පිට පමණකි.

(3) සමාජයේ ස්වාභාවික වූත්, මූලික වූත්, සමූහ ඒකකය වන පවුල සමාජයේ හා රාජ්‍යයේ රැකවරණ ලැබීමේ අයිතිය දරයි.

## 17 වන වගන්තිය

(1) සෑම පුද්ගලයකුටම තනිව මෙන්ම හවුලේ ද දේපළ අයිතිය සඳහා අයිතිවාසිකම් ඇත්තේය.

(2) කිසිවෙකු සතු දේපළ බලෙන් අහිමි කිරීමට නොහැකිය.

## 18 වන වගන්තිය

සිතීමේ, හෘදයසාක්ෂිය දැරීමේ හා ආගම ඇදහීමේ නිදහස භුක්ති විඳීමේ අයිතිවාසිකම් සෑම පුද්ගලයකුම සතුව ඇත. තම ආගම හෝ විශ්වාසය වෙනස් කිරීමේ නිදහසත්, තනිවම හෝ අන්‍යයන් සමග සමූහ වශයෙන්, පෞද්ගලිකව මෙන්ම ප්‍රසිද්ධියේ තම ඇදහීම් හා ආගම ප්‍රකට කිරීමේ, ඉගැන්වීමේ, පිළිපැදීමේ, වන්දනා කිරීමේ හා අනුගමනය කිරීමේ නිදහසත් එයට ඇතුළත් වේ.

## 19 වන වගන්තිය

තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත. අනුන්ගේ බාධාවක් නොමැතිව තම මතය දැරීමට, දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් ඇති අයිතියද ඊට ඇතුළත් ය.

## 20 වන වගන්තිය

(1) සාමකාමී එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය සෑම පුද්ගලයකු සතුව ඇත.

(2) සමිති සමාගම්වලට බැඳීමට කිසිවෙකුට බලකළ නොහැක.

## 21 වන වගන්තිය

(1) කෙලින්ම හෝ නිදහස්ව තෝරාගත් නියෝජිතයින් මගින් හෝ තම රටේ රජයට සහභාගි වීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත.

(2) තම රටේ රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සෑම පුද්ගලයකුටම සමාන අයිතිවාසිකම් ඇත.

(3) රජයේ බලතලවල පදනම වන්නේ ජනතාවගේ කැමැත්තය. මේ කැමැත්ත ප්‍රකාශ වන්නේ සර්වජන ඡන්ද බලය අනුව රහසේ දෙන ඡන්දයෙන් හෝ ඊට සමාන ස්වාධීන ඡන්ද විමසීම් ක්‍රම මගින් කලින් කලට අව්‍යාජ ලෙසින් පවත්වන ඡන්ද විමසීම් මගිනි.

## 22 වන වගන්තිය

සමාජයට අයත් පුද්ගලයකු වශයෙන් සෑම පුද්ගලයකුටම සමාජ ආරක්ෂාව හිමි වේ. සෑම රාජ්‍යයකම සංවිධානය හා සම්පත්වලට අනුකූලව තමන්ගේ ගරුත්වයටත් තම පෞරුෂත්වයේ වර්ධනයටත් අත්‍යවශ්‍යවන ආර්ථික සමාජයික හා සංස්කෘතික අයිතීන් ජාතික ප්‍රයත්නයන්ගෙන් හා ජාත්‍යන්තර සහයෝගිතාවයෙන් ද ඒ ඒ රාජ්‍යයන්ගේ සංවිධාන හා සම්පත්වලට අනුකූලව ද සාක්ෂාත් කර ගැනීමේ හිමිකම සෑම පුද්ගලයකුම සතුව ඇත්තේය.

## 23 වන වගන්තිය

(1) වැඩ කිරීමටත් තම රැකියාව නිදහස්ව තෝරා ගැනීමටත් සාධාරණවූත් යුක්ති යුක්ත වූත් වැඩ කිරීමේ පහසුකම් ලැබීමට මෙන්ම විපතින් ආරක්ෂා ලැබීමටත් සෑම පුද්ගලයකුටම හිමිකම ඇත්තේය.

(2) කිසිදු විශේෂතාවයක් හෝ වෙනස්කමක් නොමැතිව සමාන වැඩට සමාන වැටුප් ලැබීමේ අයිතිය සෑම පුද්ගලයකු සතුව ඇත.

(3) වැඩ කරන සෑම පුද්ගලයකුටම තමන්ට හා තම පවුලට මිනිස් ගරුත්වය රැකෙන ජීවිතයකට අවශ්‍ය සාධාරණ වැටුපක් ලැබීමටත් අවශ්‍ය වුවහොත් අවශේෂ සමාජ ආරක්ෂාවන්ට රැකවරණ අත්කර ගැනීමටත් අයිතිය ඇත.

(4) ස්වකීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වෘත්තිය සමිති ඇති කර ගැනීමට හා ඒවාට බැඳීමටත් සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

## 24 වන වගන්තිය

වැඩ කරන පැය ගණන් පිළිබඳ සීමාවක් ඇතිව කලින් කලට ලැබෙන වැටුප් සහිත නිවාඩු දිනයන් ද ඇතුළුව විවේක ගැනීමේ අයිතිය සෑම පුද්ගලයකුම සතු වේ.

## 25 වන වගන්තිය

(1) ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය සේවා ආරක්ෂාව සහ අවශ්‍ය සමාජසේවා ආරක්ෂාව ද ඇතිව තමන්ගේත් තම පවුලේත් සෞඛ්‍යයට හා යහපතට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමටත් රැකියාව අහිමිවීම රෝගාබාධ, දුබලතාව, වැන්දඹුවීම, මහළු බව හා වෙනත් තමන්ට පාලනය නොකළ හැකි ආපදාවලින් ජීවිකාව දුෂ්කර වූ විට රැකවරණ ලැබීමටත් සෑම පුද්ගලයකුටම අයිතියක් ඇත.

(2) මාතෘ භාවය හා ළදරු භාවය විශේෂ උපකාර හා ආරක්ෂාව උරුම තත්ත්වයෝය. විවාහක හෝ අවිවාහක මව්වරුන්ගෙන් ලැබෙන සියළුම දරුවෝ සමාන ආරක්ෂාවට හිමිකම් ඇත්තෝය.

## 26 වන වගන්තිය

(1) අධ්‍යාපනය ලැබීමට සෑම පුද්ගලයකුටම අයිතියක් ඇත්තේය. ප්‍රාථමික හා මූලික අවස්ථාවලදී පමණක්වත් අධ්‍යාපනය නොමිලේ විය යුතුය. ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය විය යුතුය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය ලැබීමට සාමාන්‍යයෙන් අවස්ථාව සැලසිය යුතු වන අතර දක්ෂතා පදනම් කොට උසස් අධ්‍යාපනය අත්කර ගැනීමේ අවස්ථාව සමානව සැලසිය යුතුය.

(2) මිනිස් පෞරුෂත්වය පරිපූර්ණ සංවර්ධනයට පත් කරන අතටත්, මානව අයිතිවාසිකම් හා මූලික ස්වාධීනතාවයන් පිළිබඳ ගරුත්වය ප්‍රබල වන අතටත්, අධ්‍යාපනය යොමු කරවිය යුතුය.

මිනිස් ප්‍රජාවගේ සියලු රාජ්‍යයන්, ජාතීන් හා ආගමික කණ්ඩායම් අතර අන්‍යොන්‍ය අවබෝධයක්, උපේක්ෂාව හා මිත්‍රත්වයන් වර්ධනය වන අන්දමින් ඒ අධ්‍යාපනය සකස්විය යුතුය. සාමය උදෙසා එක්සත් ජාතීන් ගෙන යන ක්‍රියාමාර්ගයට ද, එය අනුබලයක් විය යුතුය.

(3) තම දරුවන්ට දිය යුත්තේ කුමන අධ්‍යාපනයක් දැයි තෝරා ගැනීමේ මුල් අයිතිය මව්පියන් සතුය.

## 27 වන වගන්තිය

(1) සමාජයේ සංස්කෘතික ජිවිතයට නිදහසේ සහභාගි වන්නටත්, කලාවෙන් ආශ්වාදය භුක්ති විඳීමට හා විද්‍යාත්මක දියුණුවට සහභාගි වී එහි ප්‍රතිඵල භුක්ති විඳීමටත් සෑම පුද්ගලයකුටම අයිතියක් ඇත්තේය.

(2) තමන්ගේ කර්තෘත්වයෙන් නිෂ්පාදිත විද්‍යාත්මක, සාහිත්‍යමය හෝ කලාත්මක කෘතියකින් ජනිතවන අධ්‍යාත්මික හා භෞතික ඵල ප්‍රයෝජන රැක ගැනීමේ අයිතිය සෑම පුද්ගලයකු සතුව ඇත.

## 28 වන වගන්තිය

මෙම ප්‍රකාශනයෙහි සඳහන් අයිතිවාසිකම් හා ස්වාධීනතාවයන් පරිපූර්ණව සාක්ෂාත් කරගත හැකිවන සමාජ හා ජාත්‍යන්තර රටාවකට සෑම පුද්ගලයකුටම අයිතියක් ඇත.

## 29 වන වගන්තිය

(1) පුද්ගලයකුගේ පෞරුෂත්වය නිදහස් පරිපූර්ණ සංවර්ධනයකට පත්කර ගැනීමෙහි ලා ඉටු කළයුතු සමාජ යුතුකම් රැසක් සෑම පුද්ගලයකුම කෙරෙහි පැවරී ඇත.

(2) පුද්ගලයාගේ අයිතිවාසිකම් හා ස්වාධීනතාවයන් ක්‍රියාත්මක වීමේදී සීමාවක් තිබිය යුත්තේ හුදෙක් අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා ස්වාධීනතා ආරක්ෂාවීම පිණිසත්, අධ්‍යාත්මික ගුණ වගාව

සඳහා අවශ්‍යතාවයන් පිරිමැසීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මහජන සාමය හා පොදු සුභසිද්ධිය ආරක්ෂා වීම පිණිසත් පැනවෙන නීති පද්ධතියක් මගින් පමණි.

(3) එක්සත් ජාතීන්ගේ පරමාර්ථයන් හා ප්‍රතිපත්තිවලට පටහැනි වන අන්දමකින් මෙම අයිතිවාසිකම් හා ස්වාධීනතාවයන් ක්‍රියාත්මක නොකළ යුතුය.

## 30 වන වගන්තිය

මේ ප්‍රකාශනයෙහි සඳහන් කිසිදු අයිතිවාසිකමක් හෝ ස්වාධීනතාවයක් වැනසී යන අන්දමේ කිසිම ක්‍රියාමාර්ගයකට අයිතියක් කිසිදු රාජ්‍යයකට, කණ්ඩායමකට හෝ පුද්ගලයකුට අත්වන අන්දමේ අර්ථ නිරූපනයක් මේ ප්‍රකාශනයෙහි කවර වගන්තියකින් හෝ නොකළ යුතුය.

9789558929254

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

අංක 165, කින්සි පාර, කොළඹ - 08.

දුරකථන / தொலைபேசி / Telephone: 0112-694925, 2685980, 2685981, 2685339

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

இல 165, கின்சி வீதி, கொழும்பு - 08.

ෆැක්ස් / தொலைநகல் / Fax: 0112-694924

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

No 165, Kynsey Road, Colombo - 08.

E-mail : sechrc@sltnet.lk

Web : www.hrcsl.lk